中国国际广播电台
CHINA RADIO INTERNATIONAL

# සුභාසර

මංගල කලාපය - පළමු කාණ්ඩය - 01 වෙළුම

# 莲花



中国国际广播电台和斯里兰卡红十字协会联合出版

# CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය ....

**චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ උපදේශකත්වයෙන් හා කොන්ෆියුසියස් මූලස්ථානයේ (හන්බන්) අනුග්‍රහයෙන් පවත්වාගෙන යනු ලබන මෙම ආයතනය ශ්‍රී ලංකාවේ පාසලක පිහිටුවා ඇති එකම කොන්ෆියුසියස් මධ්‍යස්ථානයයි.**

**චීන භාෂාව හා සංස්කෘතිය ශ්‍රී ලාංකිකයන් වෙත දායාද කිරීමේ අරමුණින් කොන්ෆියුසියස් මධ්‍යාස්ථානය පිහිටුවා ඇත.**







මෙම වර්ෂයේ ජනවාරි මාසයේ සිට චීන භාෂාව පිළිබඳ ප්‍රධාන පාඨමාලා 4 ක් ක්‍රියාත්මක වේ. වයස අවුරුදු 18ට අඩු පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා YCT Level 1,2,3,4, වශයෙන් පැවැත්වෙන පාඨමාලා හතර සඳහා කාලය වර්ෂ දෙකකි. Level 1 හා 2 පාඨමාලා සඳහා මාස 04 බැගින් ද Level 3 හා 4 පාඨමාලා සඳහා මාස 08 බැගින් ද වශයෙන් මෙම දෙවර්ෂය සඳහා විෂය නිර්දේශ සැලසුම් කර ඇත. එක් එක් අදියර අවසානයේ හන්බන් ආයතනය විසින් විභාගයක් පවත්වන අතර සතුටුදායක ප්‍රතිඵල අත්කර ගන්නා අභ්‍යාසලාභීන්ට ඊළඟ පාඨමාලාව අධ්‍යයනය කළ හැකිය.

තවද වයස අවුරුදු 18 ට වැඩි වැඩිහිටියන් සඳහා HSK Level 1,2,3,4 වශයෙන් පාඨමාලා 04ක් ආරම්භ කර ඇත. HSK Level 1 පාඨමාලාව සඳහා කාලය මාස 04 කි. Level 2 පාඨමාලාව සඳහා ද කාලය මාස හතරකි. Level 3 හා 4 පාඨමාලා සඳහා කාලය මාස 08 බැගින් වේ. ඒ අනුව පාඨමාලා 4 සඳහා ම දෙවර්ෂයක කාලයක් ගතවේ. චීන භාෂාව ලිවීම කියවීම කථා කිරීම හා සවන් දීම යන සිව් වැදෑරුම් භාෂා කාර්යයන් පිළිබඳ නිපුණතාව ලබාදීම මෙම පාඨමාලාවල අරමුණු වේ.

සියළුම පාඨමාලා වල ඒ ඒ අදියර අවසානයේ දී හන්බන් ආයතනය විසින් පවත්වනු ලබන විභාග ප්‍රතිඵල මත ඊළඟ අදියර අධ්‍යයනය සඳහා සුදුසුකම් ලබයි. සෑම විභාගයක් වෙනුවෙන්ම ජාත්‍යන්තර වශයෙන් පිළි ගනු ලබන සහතික පත්‍රයක් ලබා දීමට හන්බන් ආයතනය කටයුතු කරයි. මේ හැර කොන්ෆියුසියස් මධ්‍යාස්ථානය 2014 වර්ෂයේ සිට ආරම්භ කරන ලද නව සේවාවක් වනුයේ චීනයේ විශ්ව විද්‍යාල වල ඕනෑම පාඨමාලාවක් හැදෑරීමේ අවස්ථාව ශ්‍රී ලංකා සිසුන් වෙත ලබාදීමේ සම්බන්ධීකාරක ලෙස ක්‍රියා කිරීමයි. දැනටමත් යුන්නෑන් සරසවිය ශ්‍රී ලංකා සිසුන් ඇතුළත් කරගැනීමේ කාර්යය ආරම්භ කර ඇත.

චීනයට අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීමේ කාර්යය ද මධ්‍යස්ථානය විසින් ඉටුකරන තවත් සේවාවකි. මේ අනුව දින 03, 05, සතිය හා දෙසතිය වශයෙන් වූ අධ්‍යාපන චාරිකාවල නිරත වීමේ අවස්ථාව ශ්‍රී ලාංකිකයන්ට ලැබීමේ අවස්ථාව නුදුරු කාලයේ දීම උදාවනු ඇත.

මෙම ආයතනය හා සම්බන්ධ වී මෙම සේවාවන් ලබා ගැනීමට ඔබට ආරාධනා කරමු.

**Lumbini College, Havelock Town, Colombo 05. P. O. Box: 1774. Tel/Fax 00 94 11 2589747**
**E-mail: criconfuciusclass@gmail.com**

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

**SINHALA SERVICE**

**CHINA RADIO INTERNATIONAL**



No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040
Tel: 00 86 10 6889 2330/2374
Fax: 00 86 10 68892361
Email: sinhalaservice@gmail.com
Web: http://sinhalese.cri.cn/
Facebook: Cheena Sinhala handa
Twitter: Voice of China-Lanka



2014 මාර්තු - මැයි

**අනුශාසකත්වය**

වං සියඕ තුං
ජගත් අබේසිංහ
සුදත් මඩුගල්ල

**ප්‍රධාන සංස්කාරක**

ෂෞ ලී

**සංස්කාරක**

ෂාඕ ජී යං

**ග්‍රැෆික් නිර්මාණය**

සම්පත් සමීර පෙරේරා
රෙඩ්මෝ ප්‍රින්ටින්

**ප්‍රකාශනය**

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය
සහ
ශ්‍රී ලංකා රතු කුරුස සමාජය

**මුද්‍රණය**

රෙඩ්මෝ ප්‍රින්ටින්
104, රතු කුරුස ගොඩනැගිල්ල,
ධර්මපාල මාවත, කොළඹ 07.


# පටුන


චීන මහා ප්‍රාකාරය 2

අධිරාජ මාළිගය 4

චීන උද්‍යාන 9

පොටාලා මාළිගය 11

චීන සත්ව රාශි ලකුණු 13

චීන කවිය - සිත් බැඳි ගඟ 15

බෙල්ලා සහ කැස්වටුවාගේ
සටනින් ජය කාට ද? 16

ප්‍රථමාධාර හඳුනාගනිමු 17

ප්‍රජාව සවිබල ගැන්වීමේ ඒකාබද්ධ
වැඩසටහන - ශ්‍රී ලංකා රතු කුරුස සමාජය 20

බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලය 22

චීන ඔලිම්පික් සිහිනයේ පුරෝගාමියා 25

එදිනෙදා චීන බස
පළමුවන පාඩම සහ දෙවන පාඩම 27

ටිබෙට් ඉතිහාසය 29

චීන ජනතාවගේ අභ්‍යවකාශ සිහිනය 32

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ
සිංහල සේවය 34

කොන්ෆියුසියස් මධ්‍යස්ථානය 37

නෙළුම් කොළයේ කුකුල් මස් 38



# චීන මහා ප්‍රාකාරය

ලෝක පුදුම හතෙන් එකක් ලෙස සැළකෙන චීන මහා ප්‍රාකාරය ලෝකයේ ඉතාම දිගු කාලයක් පුරා ඉදි කරන ලද විශාලතම යුද ආරක්ෂක ව්‍යාපෘතියක්. චීන මහා ප්‍රාකාරයේ දිග කිලෝමීටර් 7000කට වැඩිය. 1987 වසරේදී චීන මහා ප්‍රාකාරය ලෝකයේ විශ්ව හිමිකම් නාම ලැයිස්තුවට ඇතුළත් කරන ලදී.

චීන මහා ප්‍රාකාරය ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරන ලද්දේ ක්‍රි.පූ. 9වැනි සියවසේ සිටය. එකල උතුරු චීනයේ විවිධ ජාතීන් දියත් කළ ආක්‍රමණවලින් ආරක්ෂා වීම සඳහා, මධ්‍යම චීන ප්‍රදේශයේ සිටි ආණ්ඩු විසින් අනතුර සංඥා කිරීමේ අට්ටාල හා බල කොටු තාප්ප මගින් එකිනෙකට සම්බන්ධ කෙරිණ. මහා ප්‍රාකාරය ඇති වූයේ ඒ ආකාරයටය. වසන්ත-සරත් යුගය සහ යුද වැදුණු රාජ්‍ය පැවති යුගය වූ විට, ඒ ඒ ප්‍රදේශ වල පාලකයන් තම ආධිපත්‍යය සඳහා බොහෝ විට යුද්ධ දියත් කළහ. විශාල රටවල් එකිනෙකකින් ආරක්ෂා වී සිටීම සඳහා තම තමන්ගේ දේශසීමා ප්‍රදේශවල පිහිටා තිබෙන කඳුවැටි ප්‍රයෝජනයට ගනිමින් මහා ප්‍රාකාර ඉදි කළේය. ක්‍රි.පූ. 221 වසරේදී ඡිං රජ පෙළපතේ පළමුවැනි අධිරාජයා විසින් චීනය එක්සත් කරනු ලැබීමෙන් පසු ඒ ඒ සුළු රටවල් ඉදි කළ මහා ප්‍රාකාර කොටස් එකට සම්බන්ධ කර එය උතුරු දේශසීමා ප්‍රදේශයේ ආරක්ෂක පවුරක් බවට පත් කෙරිණ. ඒ මහා ප්‍රාකාරය නිසා උතුරු ප්‍රදේශයේ මහා තණබිමේ සිටි එඬේරුන්ගේ අශ්වාරෝහක හට ප්‍රහාර වැළැක්වීමට හැකි වීය. එකල තිබුණු මහා ප්‍රාකාරය දිගින් කිලෝමීටර් 5000කට වැඩිය. ඡිං රජ පෙළපත් කාලයට පසුව හන් රජ පෙළපත විසින් මහා ප්‍රාකාරය කිලෝමීටර් දසදහසක් දක්වා දික් කරන ලදී. වසර 2000කට වැඩි ඉතිහාසයකදී චීනයේ ඒ ඒ රජ පෙළපත්වල නායකයෝ නොයෙක් ප්‍රමාණවලින් මහා ප්‍රාකාරය ඉදි කිරීමට දායක වූහ. විවිධ රජ පෙළපත් ඉදි කළ මහා ප්‍රාකාරය එකතු

කළහොත් ඒවායේ මුළු දිග ප්‍රමාණය කිලෝමීටර් පනස් දාහකට වැඩි වෙයි. එම දිග ප්‍රමාණය පෘථිවි ගෝලයේ පරිධියට වඩා වැඩි වෙයි.

චීන මහා ප්‍රාකාරය ලෙසින් දැනට සාමාන්‍යයෙන් සැළකෙනුයේ මිං රජ පෙළපත් කාලයේ ඉදි කළ මහා ප්‍රාකාරයයි. එය බටහිර චීනයේ ගාන්සූ පළාතේ පිහිටි චා යූ ගුවැන් ප්‍රදේශයේ පටන් ගෙන ඊසානදිග චීනයේ ලියෞ නීන් පළාතේ පිහිටි යා ලු ගං ඉවුර දක්වා දිවෙයි. පළාත්, නගර හා ස්වයංපාලිත කලාප 9ක් හරහා දිවෙන චීන මහා ප්‍රාකාරය දිගින් කිලෝමීටර් 7300ක් පමණ වෙයි. ආරක්ෂක ව්‍යාපෘතියක් මෙය, කාන්තාර, තණබිම සහ වගුරුබිම ඇතුළු ව්‍යාකූල භූ විශ්මතාව හරහා දිස්වෙයි. චීන ජාතීන්ගේ මුතුන් මිත්තන්ගේ බුද්ධිය එයින් මතු වී පෙනෙයි.

චීන මහා ප්‍රාකාරය උසස් ඓතිහාසික හා සංස්කෘතික වැදගත්කමකින් සහ සංචාරක වටිනාකමකින් පොහොසත් ය. "මහා ප්‍රාකාරයේ මුදුනට නැග නැත්නම් ඔහු වීරයකු නොවේ" යනුවෙන් චීනයේ කියමනක් තිබේ. මහා ප්‍රාකාරයේ මුදුණට නගින්නට සමත් වීම චීනයේ සංචාරයේ යෙදුණු බොහෝ විදෙස් නායකයන් ඇතුළු දේශීය විදේශීය සංචාරකයෝ ආඩම්බරයට කරුණක් ලෙස සලකති. හිටපු ඇමෙරිකානු ජනාධිපතිවරුන් වන රිඩඩ් නික්සන් මහතා හා රොනල්ඩ් රේගන් මහතා, බ්‍රිතාන්‍ය දෙවැනි එලසබෙත් රැජිනිය, දකුණු අප්‍රිකානු හිටපු ජනපති නෙල්සන් මැන්ඩලා මහතා සහ රුසියාවේ හිටපු ජනපති බෝරිස් යෙලෙට්සින් මහතා ඇතුළු විදේශක රාජ්‍ය නායකයන් 300කට වැඩි දෙනෙක් හා ලෝකයේ ප්‍රසිද්ධ පුද්ගලයන් බොහෝ දෙනෙක් මේ වන විට චීන මහා ප්‍රාකාරය නරඹා තිබේ.

අද සුරැකිව තිබෙන මහා ප්‍රාකාර කොටස් කීපයක් අතර බෙයිජිංහි පිහිටා තිබෙන බා දා ලීන් සහ ස් මා තායි, එම මහා ප්‍රාකාරයේ නැගෙනහිර කොටසේ පිහිටි ශාන් හායි ගුඇන් දුර්ගය විශේෂයෙන් සඳහන් කළ යුතුය. ඒවා ඉතාමත් ප්‍රසිද්ධ සංචාරක ස්ථාන බවට පත්ව තිබේ. චීන මහා ප්‍රාකාරය සිය ඉපැරණි හා සිත් ගන්නා සුළු පෙරදිග අද්භූත ලක්ෂණයෙන් යුක්තව හැම විට ම සංචාරකයන් ආකර්ෂණය කර ගනී.





# අධිරාජ මාළිගය



## 1. අධිරාජ මාළිගය පිළිබඳ හඳුන්වාදීම

බෙයිජිං නගර මධ්‍යයේ පිහිටා තිබෙන අධිරාජ මාළිගය කළින් තහනම් නගරය වශයෙන් හැඳින්විණ. එය ගොඩ නගන ලද්දේ  මිං රාජ්‍ය පෙළපත් යොංල සමයේ 18 වන පාලන වර්ෂයේදීය (ක්‍රි.ව.1420). මිං සහ චිං රාජ්‍ය පෙළපත් දෙකෙහි රජවරුන් 24 දෙනෙක් මෙහි වාසය කළහ. සැසඳිය නොහැකි ඉපැරණි ශ්‍රේෂ්ඨ ගොඩනැගිලි සංකීර්ණයක් වූ එම මාළිගය, වත්මන් ලෝකයේ පවතින විශාලතම සහ අංග සම්පූර්ණ දැවයෙන් තැනූ පැරණි ගොඩනැගිලි සංකීර්ණය වන්නේ ය.

නැගෙනහිර සිට බටහිරට මීටර් 750ක් පළල්ව සහ දකුණේ සිට උතුරට මීටර් 960ක දිගින් යුක්තවල ලොව අග්‍රස්ථානය ගන්නා අධිරාජ මාළිගයට වර්ග මීටර් හත් ලක්ෂ විසි දාහක වපසරියක් තිබේ. සම්පූර්ණ ගොඩනැගිලි සංකීර්ණය සමන්විත වනුයේ කොටස් දෙකකිනි. ඉදිරි කොටස "රාජ්‍ය කටයුතු ක්‍රියාත්මක  කළ ස්ථානයයි". ඇතුළත කොටස "රජතුමන්ගේ පවුලේ සාමාජිකයන් වාසය කළ ස්ථානයයි". සියලුම ගෘහ නිර්මාණ ව්‍යූහය, ගොඩනැගිලි සංකීර්ණයේ සෑම පැත්තකින්ම ප්‍රාකාර සහ නදියෙන් වට වී තිබේ. මාළිගයේ කොන් හතරෙහි අට්ටාල ද දිසා හතරෙහි ද්වාර ද ඇත. අධිරාජ මාළිගයේ ප්‍රධාන පිවිසුම් මග වන දකුණෙහි ඇති ද්වාරය "වුමන්" යනුවෙන්  හැඳින්වෙයි. එය එම අධිරාජ්‍ය මාළිගයේ ප්‍රධාන දොරටුවයි. ජනප්‍රවාදවල සටහන්වලට අනුව, අධිරාජයාට කාමර 10000 තිබේ. එම නිසා, අධිරාජයා ඉක්මවා යෑම වැළැක්වීම පිණිස, අධිරාජ මාළිගයට කාමර 9999 ක් සහ තවත් කාමර අඩක් ඇත. එය සත්‍ය වශයෙන්ම කාමර 8704 කි.

චීනයේ බෙයිජිං නුවර පිහිටි අධිරාජ මාළිගය ලොව ශ්‍රේෂ්ඨතම මාළිගා පහෙන් එකක් ලෙස හැඳින්වෙයි. සෙසු ශ්‍රේෂ්ඨතම මාළිගා වනුයේ ප්‍රංශයේ වර්යසිල්ස් මාළිගය, බ්‍රිතාන්‍යයේ බකිංහැම් මාළිගය, ඇමරිකාවේ ධවල මන්දිරය සහ රුසියාවේ ක්‍රෙම්ලින් මන්දිරයයි. අධිරාජ මාළිගය ලොව සංස්කෘතික උරුමයක් ලෙස යුනෙස්කෝව විසින් නම් කරනු ලැබ තිබේ. එම නම් කිරීමේදී යුනෙස්කෝව විසින් මෙම මාළිග යේ විශිෂ්ටත්වයන් අගය කරනු ලැබිණ. ශතවර්ෂ පහකට අධික පෞරාණික බව, උත්තරීතර රාජ්‍ය බල කේන්ද්‍ර ස්ථානය වීම, එහි උද්‍යානාලංකරණය, ගෘහ භාණ්ඩ හා කලා කෘති සහිත කාමර 9000ක යෝධ ගෘහ නිර්මාණ ශිල්පය සේම, මිං සහ චිං රාජ්‍ය පෙළපත්වල පැවති ශිෂ්ටාචාරය පිළිබඳ ජීවමාන ඓතිහාසික සාක්ෂියක් වීම යන කරුණු ඒ අනුව අගය කිරීමට ලක් වී තිබේ.

## 2. අධිරාජ මාළිගයේ මූලික ආකෘතිය

මිං රාජ්‍ය සමයේදී ගොඩනගන ලද බෙයිජිංහි අධිරාජ මාළිගය චීනයේ හන් ජාතික ගෘහ නිර්මාණ ශිල්පයේ ආදර්ශමත් සංකේතයකි. චිං රාජ්‍ය සමය, මිං රාජ්‍ය සමයේ පැවති එම ගෘහ නිර්මාණ ශෛලිය අඛණ්ඩවම අනුගමනය කළ අතර එය විදහා පෑමද සිදු කරනු ලැබිණ.

මිං රාජ්‍ය පෙළපතේ වූ ඩී රජුතුමාගේ විධානයෙන් ක්‍රිස්තු වර්ෂ 1406දී ඉදි කිරීමට පටන් ගත් අධිරාජ මාළිගයේ ක්‍රිස්තු වර්ෂ 1420දී මූලික වශයෙන් නිම කරනු ලැබූ ගොඩනැගිලි ක්ෂේත්‍රඵලය, වර්ග මීටර් එක් ලක්ෂ පනස් පන්දාහක් පමණි. දකුණේ සිට උතුරට මීටර් 960 ක් දිගැති එම මාළිගය නැගෙනහිර සිට බටහිරට මීටර් 750 ක දිගකින් යුක්තය.

අධිරාජ මාළිගයේ ප්‍රධාණ පිවිසුම් මාර්ගය ලෙස "වුමන්" දොරටුව ද, නැගෙනහිර පිවිසුම් මාර්ගය ලෙස "තුං හුවා" දොරටුව ද, බටහිර පිවිසුම් මාර්ගය ලෙස "ෂීහුවා" දොරටුව සහ උතුරු පිවිසුම් මාර්ගය ලෙස "ෂෙන්වු" දොරටුව ද ඇතුළුව දොරටු හතරක් තිබේ. ෂෙන්වු දොරටුවට මුහුණලා, පස්වලින් සහ ගලින් සෑදූ ජිංෂන් පර්වතය වේ. පර්වතය පුරා සිටුවන ලද පයින් සහ සයිප්‍රස් ගස් සමඟ එය ජිංෂන් උද්‍යානය ලෙස චීන සමූහාණ්ඩු සමයේදී නැවත ගොඩනගන ලදී. සමස්ත සැලැස්මට අනුව, ජිංෂන් පර්වතය, මාළිග ගෘහ නිර්මාණාත්මක සංකීර්ණයේ කෘත්‍රිමය ආරක්ෂක තිරය ලෙස ව්‍යවහාර වෙයි.

මෙහි මාළිගා, දකුණු සහ උතුරු කෙළවර සිට මධ්‍යම දෙසට වූ මධ්‍ය අක්ෂය දිගේ ඉදිකර ඇත. ද්විපාර්ශවික සමමිතිය සේම උතුරෙහි සහ දකුණෙහි සෘජු සැලැස්ම සහිත දෙපසට විහිදෙන මධ්‍ය අක්ෂය මත ප්‍රධාන ශාලා තුන, ප්‍රධාන මාළිගා තුන සහ රාජකීය උද්‍යානය පිහිටා ඇත. මෙම මධ්‍ය අක්ෂය තහනම් නගරයේ පමණක් නොව, උතුරු දෙසට බෙර කුළුණ සහ සාණ්ඨාර කුළුණ සේම දකුණට වන්නට "යොංඩිං මන්" දොරටුව දක්වා ද විහිදේ. මුළු බෙයිජිං නගරය පුරා දිවෙන, ගාම්භිරත්වය සහ මනා සැළසුම්කරණය සමගින් එය අතිශයින්ම දර්ශණීය වේ.

අධිරාජ මාළිගයෙහි වාස්තු විද්‍යාත්මක සැලැස්ම සහ කාර්යයන් මත, "ඉදිරි කොටස" රාජ්‍ය කටයුතු ක්‍රියාත්මක කළ ස්ථානයයි. "ඇතුළත කොටස" රජතුමන්ගේ පවුලේ සාමාජිකයන් වාසය කළ ස්ථානයයි. ඒ අනුව ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. ජියැන් චිං දොරටුවට දකුණෙන් ඉදිරි කොටස වන අතර ඊට උතුරෙන් ඇතුළත කොටස වේ.

උතුම් සමයේ මාළිගාව, සමගියේ මැද මාළිගාව සහ සමගි සුරක්ෂණ මාළිගාව යන මාළිගා තුන කේන්ද්‍ර කරගන්නා ඉදිරි කොටස වැඩවසම් අධිරාජයන් රාජ්‍ය කටයුතු ක්‍රියාත්මක කොට උත්කෘෂ්ඨ උත්සව පැවැත්වූ ස්ථානයයි. එම ස්ථානය ස්වර්ණ සිංහාසනය සහ ඉදිරි රාජ්‍යය ජනතාව හැඳින්විය. කේන්ද්‍රගත ස්ථානයට දෙපැත්තෙන් නැගෙනහිරට වෙන්හුවා මන්දිරය, වෙන්යුඅන් මණ්ඩපය, රාජකීය නිවාස සංකීර්ණ ඇතුළු ගොඩනැගිලි සහ බටහිරට රාජකීය පුස්තකාලය සහ සිවිල් කටයුතු සේවා කාරක ගොඩනැගිලි ස්ථාපිත කරනු ලැබිණ .

ජියැන්චිං මාළිගාව, ජියාඕතැයි මාළිගාව සහ කුන්නිං මාළිගාව යන මාළිගා තුනකින් ඇතුළත කොටස සමන්විත වෙයි. යාංසින් මන්දිරය, නැගෙනහිර මාළිගා හය, බටහිර මාළිගා හය, පූජාප්‍රසාද මාළිගය සහ චිත්ත වර්ධන මාළිගය දෙපැත්තේ ස්ථාපිත කරනු ලැබිණ. පසුපසින් තිබෙන අධිරාජ උද්‍යානය රජු සහ බිසොව ඇතුළු රාජකීය පවුලේ සාමාජිකයන් ජීවත් වන ස්ථානයයි. නැගෙනහිරින් තිබෙන නිංසාඕ මාළිගාව අධිරාජයා විසින් සිය සාමකාමී සහ දීර්ඝායුෂ විශ්‍රාම ජීවිතය සඳහා ගොඩනගන ලදකි. බටහිරට සි නිං මාළිගය සහ සෞ අන් මාළිගය චොන්හුවා මාළිගය සහ උතුරු මාළිගා පහ යනාදි ගොඩනැගිලි පවති.

## 3. අධිරාජ මාළිගය පිළිබඳ ඉතිහාසය

යුආං රාජ්‍ය පෙළපතෙහි මාළිගය මත පදනම්ව මිං රාජ්‍ය පෙළපතෙහි වූ ඩී අධිරාජයා විසින් ක්‍රි.ව. 1406





අරඹන ලද බෙයිජිංහි අධිරාජ මාළිගය නිල වශයෙන් ක්‍රි.ව. 1420 දී සම්පූර්ණ කරන ලදී. මාළිගය නිමාවුදා සිට 1911 හේ දී චිං රාජ්‍ය පෙළපත අධිරාජ්‍ය බලය අත්හැරීම දක්වා වර්ෂ 500ක පමණ කාලයක් තුළදී මිං සහ චිං රාජ්‍ය පෙළපත් දෙකේ අධිරාජයන් 24 දෙනෙකු මෙහි වාසය කළහ.

## 4. අධිරාජ මාළිගයේ ප්‍රධාන ගොඩනැගිලි පිළිබඳ හඳුන්වා දීම

අධිරාජ මාළිගය වාස්තු විද්‍යාත්මක නිර්මාණ මත පදනම් කොට ගෙන "පිටත රාජ්‍ය" සහ "ඇතුළත මන්දිරය" යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇත. උතුම් සමගි දොරටුව ඇතුළත වර්ග මීටර් 30,000 කට වඩා පුළුල් මැද මිදුලක් තුළ රාජ්‍ය කටයුතු කිරීමේ කේන්ද්‍රය වෙයි. විශාල මාළිගා තුන හැඳින්වෙන්නේ උතුම් සමගියේ මාළිගය, සමගියේ මැද මාළිගය සහ සමගි සුරක්ෂණ මාළිගාව ලෙසිනි. අධිරාජ මාළිගාවේ ප්‍රධාන ගොඩනැගිලි සංකීර්ණය මෙය වෙයි. විවිධ නිර්මාණ ආකාර සහ වහල හැඩවලින් යුක්ත එම වාස්තු විද්‍යාත්මක නිර්මාණ අතිශයින් විචිත්‍රය.

### උතුම් සමගියේ මාළිගය

අධිරාජ මාළිගයෙහි විශාලතම දැවමය මාළිගය වන උතුම් සමගියේ මාළිගය චීනයේ ද විශාලතම දැවමය මාළිගය වෙයි. මිං රාජ්‍ය පෙළපත් සමයේදී දේව මාළිගාව සහ අධිරාජ්‍ය මාළිගාව ලෙස හඳුන්වන ලද උතුම් සමගියේ මාළිගය, ජනතාව විසින් ස්වර්ණ සිංහාසනය නමිනුත් හඳුන්විනු ලැබිණ. මුළු ශාලාවම අභිමානනීය සහ මනෝහර ලෙස දිදුළන සහ තේජස් වී ආකාරයෙන් සරසා ඇත. එය අධිරාජයන් සඳහා වැදගත් උත්සව පැවැත්වීමේ ස්ථානය වීමෙන් අධිරාජයන්ගේ අභිෂේකය, උපන්දින සහ මංගල උත්සව සියල්ල මෙහි පැවැත්වෙයි. එම මාළිගාව රන් පාටින් හා ගාම්භිරාකාරයෙන් යුක්තය.

### සමගියේ මැද මාළිගාව

මුලින්ම හුවාකැයි මාළිගාව ලෙසත් පසුව චොංචි මාළිගාව ලෙසත් නම් කරනු ලැබූ මෙම මාළිගාව චිං රාජ්‍ය පෙළපතේ ශුවෙන් ෂි සමයේ දෙවැනි වසරේ එනම් ක්‍රි.ව. 1645හේ සිට සමගියේ මැද මාළිගාව වශයෙන් හඳුන්වනු ලැබේ. මිං රාජ්‍ය පෙළපතේ යොංල සමයේ 18 වන වර්ෂයේ (ක්‍රි.ව. 1420) තනා නිමාවට පත් වූ සමගියේ මැද මාළිගාව අධිරාජ මාළිගාවේ ප්‍රධාන ශාලා තුනෙන් එකකි. උතුම් සමගියේ මාළිගයට පිටුපසින් පිහිටා ඇති සමගියේ මැද මාළිගාව විශාල උත්සව පැවැත්වීමට පෙර අධිරාජයන් සඳහා විවේකය සහ චාරිත්‍ර විධි පුහුණු ලබාදෙන ස්ථානයයි. මෙම ශාලාව ගිනි හානි තුනක් පසුකර ඇති අතර දැනට පවතින වාස්තු විද්‍යාත්මක නිර්මාණය මිං රාජ්‍ය පෙළපතේ (ක්‍රි.ව.1627) ටියැන්ජියි සමයේ හත්වන වර්ෂයේදී නැවත ගොඩනගන ලද ආනුකරකයයි.

### සමගි සුරක්ෂණ මාළිගාව

මෙය මුලින් චින්ෂෙන් මාළිගාව ලෙස හඳුන්වන ලද අතර මිං රාජ්‍ය පෙළපතේ ජියාජිං සමයේ දී

චියැන්චි මාළිගාව වශයෙන් නම වෙනස් කරන ලදී. චිං රාජ්‍ය පෙලපතේ ශුවෙන් ෂි සමයේ සිට එය සමගි සුරක්ෂණ මාළිගාව ලෙස හඳුන්වන ලද්දේය. මිං රාජ්‍ය පෙළපතේ යොංල සමයේ 18 වන වර්ෂයේ (ක්‍රි.ව. 1420) තනා නිමාවට පත් වූ සමගි සුරක්ෂණ මාළිගාව අධිරාජ මාළිගාවේ ප්‍රධාන ශාලා තුනෙන් එකකි. සමගියේ මැද මාළිගයට පිටුපසින් පිහිටා ඇති එම මාළිගාව රාජකීය තරගකාරී විභාගවලදී අවසන් විභාගය පැවැත්වීම සඳහා මෙන්ම සෑම වර්ෂයකම නව වර්ෂයේ සන්ධ්‍යාවේ කුමාරයන් සහ ආදිපාදවරුන් වෙනුවෙන් විශේෂ භෝජන සංග්‍රහ පැවැත්වීමට ඇති ස්ථානයයි. සෑම වර්ෂ තුනකටම වරක් පවත්වනු ලබන "අවසන් රාජකීය විභාගය" රාජකීය විභාග ක්‍රමයෙහි උසස්ම විභාගය වේ. ඒ අනුව පළමු ස්ථාන තුනට ශ්‍රේණිගත කෙරෙන "අංක එකේ විද්වතා", "අංක දෙකේ විද්වතා", "අංක තුනේ විද්වතා" ඇතුළුව ලියාපදිංචි වූ අය "උගතුන්" ලෙස අමතනු ලබයි.

## 5. අධිරාජ මාළිගයෙහි කතාන්තර

### 1) ශීත මාළිගය

"ශීත මාළිගය" ගැන දැන ගැනීමට පෙර "මාළිගය තුන සහ මැද මිදුල් හය" පිළිබඳව අවබෝධ කරගැනීමට අවශ්‍යය. අධිරාජ මාළිගයේ මැද පාරෙහි ඇති ජියැන්චිං මාළිගාව ජියාඕතැයි මාළිගාව කුන්නිං මාළිගය "මාළිගා තුන" ලෙස හඳුන්වනු ලැබේ. පරම බලය සහිතව, ස්ව කැමැත්තෙන්ම වැඩවසම් අධිරාජයන්ට රාජකීය උපපත්නියන් තෝරා ගත හැකිය. තෝරා ගනු ලැබූ එම කාන්තාවන්ට පිළිබඳ ප්‍රසාදයක් නොමැති වී නම්, මරණය තෙක් අතිශයින් දුක්බදායක ඉරණමක් සහිතව රැඳී සිටීමට සිදුවිය. රාජකීය උපපත්නියන් සහ කුමරයන් සිර ගත කර තැබීම සඳහා අධිරාජ මාළිගය තුළ "ශීත මාළිගයේ" ස්ථිර නොකරනු ලබන සියළුම ස්ථානවල පිහිටීම පොදුවේ "ශීත මාළිගය" ලෙස හඳුන්වයි. මිං සහ චිං රාජ්‍ය පෙළපත්වල ඓතිහාසික දත්ත පිරික්සීමෙන් පසුව, ශීත මාළිගය යනු නිශ්චිත මාළිගයක නිළ නාමයක් නොවන බව තහවුරු විය. සමහර ලේඛනවල සටහන් අනුව, මිං සහ චිං රාජ්‍ය පෙළපත්වල ශීත මාළිගා ලෙස තෝරාගත් ස්ථාන කීපයක් තිබී ඇත.

### 2) අධිරාජ මාළිගය තුළ "මකරුන්" බොහෝ ගණනක් ඇත්තේ ඇයි?

තහනම් නගරය යනු මකරුන්ගේ ලෝකයකි. එහි මකර ස්වරූප විවිධ ඉරියව් සහ ලීලාවලින් යුක්තය. චීනයේ වැඩවසම් සමාජ ක්‍රමය තුළ, අධිරාජයන්



ලොව පාලකයන් ලෙසත් "මකරුන්ගේ පුත්‍රයන්" ලෙසත් අමතනු ලැබූහ. තහනම් නගරය, මිං සහ චිං රාජ්‍ය පෙළපත්වල අධිරාජ මාළිගය බවට පත්වීම හේතු කොට ගෙන අධිරාජයන්ගේ සහ රැජිනියන්ගේ මුද්‍රා, රෙදිපිළි සහ රාජකීය ආභරණ මෙන්ම මාළිගයේ ශාලා, පාලම්, පඩි, ගල් කැටයම් යනාදීය සියල්ලම මකරුන්ගෙන් හැඩ ගන්වා ඇත. මේ ආකාරයට, අධිරාජ මාළිගයෙහි මකරුන් කොපමණ සිටීද? කිසිවකුට මෙම සංඛ්‍යාව පැහැදිලිව කිව නොහැකිය. දළ තක්සේරුවකට අනුව, එක් කාමරයකට මකරුන් හයදෙනෙකු බැගින් සිටී නම්, මාළිගා පුරා 8000ට ආසන්න කාමරවල මකරුන් 40000 සිටිය හැකිය. මකර රූපයෙන් කැටයම් කළ සියළුම වාස්තු විද්‍යාත්මක නිර්මාණ සහ රාජකීය භාණ්ඩ ගණන් කරනු ලබන්නේ නම්, සංඛ්‍යාත්මක වශයෙන් එය විශාල ගණනක් වනු ඇත.

දළ සංඛ්‍යාලේඛනයකට අනුව උතුම් සමගියේ මාළිගයේ වහලෙහි මුදුන් වැටි උළු කැට සහ කටාරම් යනාදියේ පමණක් මකර රූප නිර්මාණ 2632 ක් වන අතර වහලෙහි පිටත අගුවේ කවුළු ලී ස්තර, දොර සහ ජනෙල්, කවුළු වර්ණ සැරසිලි වල මකර රූප නිර්මාණ 5732 කි. මාළිගයේ අභ්‍යන්තර අගුවල සහ බාල්ක සීලිංහි 4037කි. ස්වර්ණමය ස්ථම්භ, ගල්වූ කැටයම් ලෑලි, සිංහාසන, තිර සහ ගෘහ භාණ්ඩ මත 609 කි. මාළිගයේ අභ්‍යන්තර බිත්ති සහ උණුසුම් මැදිරි දොර ආවරණ මත 542 ක් මකර රූප නිර්මාණ ඇත. මෙය අසම්පූර්ණ සංඛ්‍යාවකි. උතුම් සමගියේ මාළිගයේ අභ්‍යන්තර සහ පිටත ශාලාවල පවා මකර රූ නිර්මාණ සහ මකර කැටයම් ඇතුළු විවිධ ආකෘති මකර රූප 13844 කට අධික ප්‍රමාණයක් තිබේ. මෙම ආකාරයේ සැරසිලි තේජවන්ත සහ ගුප්ත ආකාරයේ වටපිටාවක ආකෘතියකට බොහෝ මකර රූප නිර්මාණය කර ඇත්තේ අධිරාජයා දේවාරෝපිත කිරීමට සහ පොදු ජනතාව බිය ගැන්වීම සඳහාය.

### 3) ප්‍රධාන මාළිගා තුන තුළ ගස් නොමැත

උතුම් සමගියේ මාළිගාව, සමගියේ මැද මාළිගාව සහ සමගි සුරක්ෂණ මාළිගාව යන මාළිගා තුන කේන්ද්‍ර කරගත් ඉදිරි කොටස වැඩවසම් අධිරාජයන් රාජ්‍ය කටයුතු ක්‍රියාවට නංවමින් උත්කෘෂ්ඨ උත්සව පැවැත්වීමට යොදා ගන්නා ස්ථානයයි. එමෙන්ම එය බෙයිජිං නගරයේ කේන්ද්‍ර ස්ථානය වෙයි. මෙම මාළිගාව, තේජස්ගතිය ඉස්මතු කර පෙන්වීම පිණිස, වාස්තු විද්‍යා ශිල්පීන් විවිධ ක්‍රම භාවිත කර තිබේ. එයින් එකක් වනුයේ මාළිගා භූමිය ඇතුළත ගස් නොමැති වීමයි. අධිරාජ මාළිග යේ ප්‍රධාන දොරටුව වන ටියැන් අන් මන් දොරටුවේ සිට ඩුවන් මන් දොරටුව, වුමන් දොරටුව සහ උතුම් සමගියේ දොරටුව දක්වා, මෙම මැද මිදුල් පෙළෙහි කිසිදු ගසක් නොපවතී. (ඩුවන් මන් දොරටුව වටා ගස් සිටුවා ඇත්තේ 1911 විප්ලවයෙන් පසුවයි). එකල ජනතාව අධිරාජයන් බැහැ දකින්නේ නම්, ඔවුනට ටියැන් අන් මන් දොරටුවට පිවිස දිගු රාජකීය මාවත ඔස්සේ ඇවිද යෑමට අවශ්‍ය විය. උස් පහත් සහ වෙනස් වාස්තු විද්‍යාත්මක නිර්මාණ හරහා ඇවිද ගෙන යාමේදී, ඔවුනට අතින් ඇල්ලිය නොහැකි සහ වැඩි වර්ධනය වන අධ්‍යාත්මික පීඩනයක් හැඟෙනු ඇත. මේ ආකාරයට උතුම් සමගියේ දොරටුවෙන් ඇතුළු වන විට, ඔවුන්ව උපරිම අධ්‍යාත්මික පීඩනයට ලක් වෙයි. සුන්දර ආවරණ සහ කුරුළු හඬ සමග මෙම මැද මිදුල්වල ගස් වගා කළේ නම් රාජ්‍යයේ තේජස වී වටපිටාව විනාශ වී යනු ඇත.

අධිරාජ මාළිගයේ මෙම ප්‍රධාන මාළිගා තුන අසල ගස් නොමැති වීමට දෙවන හේතුව වනුයේ, චීනයේ පුරාණ අධිරාජයන් මූලධාතු පහ තුළින් "පොළොවට" අයිති වීමයි. මූලධාතු පහ යනු යකඩ, දැව, ජලය, ගින්දර සහ පොළොව වන්නේය. "දැව", "පොළොව" සමග අන්‍යෝන්‍ය බාධාවක් තිබීම, ගස් මෙලෙස ප්‍රතික්ෂේප වන්නට හේතු විය. ප්‍රධාන මාළිගා තුනේ පාදස්ථය හුදෙක් දකුණට මුහුණලා ඇති චීන "ථූ" "පොළොව" අක්ෂරය වැනිය.

තුන්වන හේතුව වනුයේ, අධිරාජයන් සහ ඇමතිවරුන් හට හානි කිරීමට ගස් අතර ඝාතකයන්ට සැඟවීමට ඉඩ නොදීමයි.





# චීන උද්‍යාන

## 1. දළ හඳුන්වාදීම:

සාම්ප්‍රදායික චීන සංස්කෘතික කලාංගයක් වන උද්‍යාන මිනිසාගේ අධ්‍යාත්මකය අලංකාර කිරීම පිණිස ගස් සහ මලින් යුතුව චාරිත්‍ර සංගීතය ආදියෙන් සරු වූ සංස්කෘතික සාරයෙන් පැන නැගුනකි.

ස්වාභාවික භූදර්ශන පාදක කර ගෙන සාදනු ලබන චීන උද්‍යාන, ස්වභාව ධර්මය අනුකරණය කිරීම සඳහා අතින් සාදනු ලබන කෘත්‍රිම මාළිගා, බරාඳ, ගොඩනැගිලි සහ මණ්ඩප ආදිය සමග පිහිටුවා ඇත. විශේෂයෙන්ම කවි, කවි ගීත සහ සිත්තම්වල එන විවිධ මට්ටම්වලින් නිරූපිත ඓතිහාසික කාල පරිච්ඡේදවල දක්නට ලැබුණු මානුෂවාදී හැඟීම් ඒවා මගින් නිරූපණය වේ.

## 2. ඉතිහාසය:

ඉතා දීර්ඝ ඉතිහාසයක් සහිත චීන උද්‍යාන චීනයේ ඓතිහාසික ගෘහ නිර්මාණ කලාවේ නිධානයක් වන අතර උද්‍යානකරණ කලාවට ද ඉතා දිගු ඉතිහාසයක් හිමි වේ.

ජින් සහ හන් රාජ වංශ සමයන්හි තිබූ උද්‍යානවල සිට, වෙයි සහ චින් රාජ වංශවලට අයත් වංශ හයේ ස්වාභාවික භූදර්ශන උද්‍යාන දක්වා ද ටාං සහ සොං රාජ වංශවල හැම පැත්තකින්ම නැරඹිය හැකි උද්‍යාන දක්වා ද ඉන්පසු එබඳු උද්‍යාන අදියරේම උසස් නිරූපණයක් වන මිං සහ චිං රාජ වංශවල ස්වාභාවික භූ දර්ශන දක්වා ද එය වර්ධනය වී ඇත. මිං රාජ වංශයේ මධ්‍යම අදියරෙන් ආරම්භ වූ පෞද්ගලික උද්‍යාන ක්‍රමයෙන් බෙදී ගියේය. දකුණු දිග යැංසි ගංගා ඩෙල්ටාවේ තිබූ උද්‍යාන පළමුව කැපී පෙනුනු අතර ඉන්පසු කඳුවැටි පහට දකුණෙන් වූ උද්‍යාන සහ උතුරුදිග උද්‍යාන වඩාත් කැපී පෙනෙන සුළු ඒවා විය. එම ප්‍රධාන වර්ග තුන අතර තිබූ අන්‍යෝන්‍ය බලපෑම සහ ස්ථිර භාවය සමග චීන උද්‍යාන වර්ග සහ විලාසයන් නොනැවතී පුළුල්



වූ අතර තව තවත් ගැඹුරු විය. අඛණ්ඩ උරුමය සහ සංවර්ධනය හරහා චීන උද්‍යානවල විශේෂිත නැගෙනහිර සංස්කෘතිය මෙන්ම උද්‍යානකරණයේ අදහස් සහ න්‍යායන් මගින් බටහිරට පවා බලපෑම් කිරීමට සමත් විය.

### 3. ලෝක උද්‍යානවලට හිමි වන ස්ථානය:

යින් සහ චෞ රාජ වංශවල පරිහානිය ඇතිවූ කාලයෙහි සිට ගණනය කිරීමේ දී චීන උද්‍යාන වලට වසර 3000 ක පමණ ඉතිහාසයක් ඇති බව පෙනේ. ලොව උද්‍යාන කලාව ආරම්භ වූ මුල්ම රටක් වන චීනය අති විශිෂ්ඨ සෞන්දර්යාත්මක ප්‍රමිතීන් සහ අද්විතීය ජාතික අනන්‍යතාවන් අනුව ලොව උද්‍යාන ඉතිහාසය තුළ ඉතා වැදගත් ස්ථානයක් හිමි කරගෙන ඇත. උද්‍යාන යනු අලංකාරය මිදීම සහ විනෝදාස්වාදය සඳහා භූ දර්ශන නිර්මාණය කිරීමට ජනතාව සිය දෑත යොදා ගන්නා කලාවක් වේ. විවිධ ජාතීන්ට අයත් විවිධ ප්‍රදේශවලින් පැමිණි ජනතාවගේ විවිධ අවබෝධයන් සහ කැමැත්ත අනුව නිර්මාණය වූ උද්‍යාන විවිධ සෞන්දර්යාත්මක දර්ශනවලින් පරිපූර්ණ වේ. කෙටියෙන් කිවහොත්, ලෝකයේ උද්‍යාන යුරෝපීය උද්‍යාන, බටහිර ආසියානු උද්‍යාන සහ චීන උද්‍යාන ලෙස ප්‍රධාන වර්ග තුනකට බෙදිය හැකි වේ. එය මිනිසා විසින් නිර්මාණය කරනු ලැබූව ද ස්වාභාවික පෙනුමෙන් යුක්ත විය යුතුය යන සෞන්දර්යාත්මක මූලධර්මය මෙන්ම සාම්ප්‍රදායික ගෘහ නිර්මාණ ශිල්පය, සාහිත්‍යය, සිතුවම්කරණය සහ ලේඛන කලාව, කැටයම් සහ කාර්මික කලාව යනාදී විවිධ කලා ශිල්පවල ලක්ෂණ ද සමග ඉතා දීර්ඝ ඉතිහාසයක් චීන උද්‍යාන වලට ඇත. සමස්ත ලෝක උද්‍යාන අතර ඒවාටම ආවේණික රටාවක් සහ ඉතා ඉහළ වටිනාකමක් චීන උද්‍යානවල හිමි වී තිබේ.



# පොටාලා මාළිගය



පොටාලා මාළිගය බෞද්ධයන්ට පුණ්‍ය භූමියකි. ටිබෙටයට මිල කළ නොහැකි සම්පතකි. ඉතිහාසඥයන්ට කෝෂ්ටාගාරයකි. පුරා විද්‍යාඥයන්ට පර්යේෂණාගාරයකි. වාස්තු විද්‍යාඥයන්ට ආදර්ශයකි. දැනුම් පිපාසිතයන්ට පුස්තකාලයකි. සංචාරකයින්ට සරසවියකි. දරු දැරියන්ට තක්සලාවකි. කැටයම්කරුවන්ට කලාගාරයකි. සිත්තරුන්ට පාරාදීසයකි.

ටිබෙටයේ ආගමික, සංස්කෘතික හා අධ්‍යාපනික පුනරුදයේ නියමුවා වන ක්‍රිස්තු වර්ෂ 617දී රාජාභිෂේකයට පත් සොංත්සන් ගම්පො කුමරු සිය ආධ්‍යාත්මික ආරක්ෂකයා වශයෙන් සැලකුයේ අවලෝකිතේශ්වර බෝධිසත්වයන් වහන්සේය. ශ්‍රී ලංකාවේ සිට ගෙන ආ අවලෝකිතේශ්වර පිළිමය තැන්පත් කිරීම සඳහා මාළිගය ඉදි කළේ සොංත්සන් ගම්පො රජතුමාය.

වන්දනා කුටි, පූජා කුටි, ලැගුම් හා පරිපාලන කුටි ආදී වශයෙන් කාමර නවසිය නවයකින් යුතුව පොටාලා මාළිගය නිර්මාණය කෙරිණ. සාමය සංකේතවත් කරලීම සඳහා මාළිගය සුදු පැහැයෙන් පිරියම් කිරීම නිසා ශ්වේත මාළිගය වශයෙන් ද හැඳින්විණ.

මාළිගාවේ ස්වර්ණමය යුගය යළි උදාවූයේ 1642 වසරේදී පස්වන දළයි ලාමා තුමන් ටිබෙට් පළාතේ පාලන බලය සියතට ගැනීමට සමත් වීමත් සමඟය. 1645දී රතු කන්දේ මාළිගාවේ ප්‍රතිසංස්කරණ කටයුතු ඇරඹුණි. ටිබෙටයේ ආගමික මෙන් ම පරිපාලන කේන්ද්‍රස්ථානය බවට ද පොටාලා මාළිගය පත්වූයේ ඒ අවදියේදීය.

වසර 40කට අධික පාලන කාලයකින් පසු පස්වන දළයි ලාමා තුමන් අපවත් වූ කල්හි එතුමන්ගේ භෂ්මාවශේෂ තැන්පත් කරලීම සඳහා 1690දී සුදු මාළිගා ගොඩනැගිල්ල අසල රතු මාළිගාව ඉදි කෙරිණ.



මහල් 13කින් සමන්විත රතු මාළිගාවේ පස්වන දළයි ලාමා තුමන්ගේ භෂ්මාවශේෂ තැන්පත් කළ ස්තූපය ඉදි කෙරුණු අතර වෙනත් පිළිම වහන්සේලා සහ ධාතූන් වහන්සේලා රාශියක් සඳහා ද කුටි නිර්මාණය කෙරිණ.



නැගෙනහිර ප්‍රවේශ දොරටුවෙන් ඇතුල් වූ කල්හි දක්නට ලැබෙන්නේ සුවිශාල එළිමහන් මණ්ඩපයකි. ඒ ඩෙයං ෂා මණ්ඩපයයි. අතීතයේ ලාමාවරුන් ටිබෙට් ඔපෙරාවන් නරඹා ඇත්තේ එහිදීය.

මණ්ඩපයට බටහිරින් ඇත්තේ සුදු මාළිගයයි. ලාමා වරුන්ගේ ලැගුම් කුටි, සාකච්ඡා ශාලා, අධ්‍යයන ශාලා සහ කාර්යාල පරිශ්‍රයන් ද පිහිටා තිබුණේ මෙම මාළිගයේය. මහල් 13කින් සමන්විත මෙම මාළිගා ගොඩනැගිලිවල බිත්ති ඉතා පළලය. අත්තිවාරමට තඹ මිශ්‍ර කර ඇත්තේ භූමි කම්පාවන්ට ඔරොත්තු දිය හැකි වන පරිදිය.

ප්‍රතිමා, ස්තූප හා වටිනා කෞතුක වස්තු සම්භාරයක් රතු මාළිගාවේ තැන්පත් කර තිබේ. ප්‍රධාන ශාලාවේ ඇතුළත බිත්ති සරසන අලංකෘත චිත්‍ර නිර්මාණ ගණනාවකි. බුද්ධ, බෝධිසත්ව හා ලාමාවරුන්ගේ රූප මෙන් ම බුද්ධ චරිතයට සම්බන්ධ කතා ගණනාවක් ද සිතුවමට නැගී ඇත. සොංත්සන් ගම්පො කුමරුගේ සහ චීන අධිරාජයාගේ දියණිය වූ වෙන් චෙං කුමරියගේ සරණ මංගල්‍යය, 1652 වසරේදී පස්වන දළයි ලාමා තුමන් චීන අධිරාජයා වූ ෂුන් ට්ෂ හමුවීමට බෙයිජිං නුවරට සැපැත්වීම ඇතුළු ඓතිහාසික චිත්‍ර ගණනාවක් ද දක්නට තිබේ.

ශාලාව වටා පූජා කුටි තුනකි. උතුරු කුටිය වෙන් කර ඇත්තේ ශාක්‍යමුනීන්ද්‍රයන්, අනෙකුත් බුදුවරයන් හා දළයි ලාමාවරුන් වෙනුවෙනි. නැගෙනහිර පූජා කුටිය කහ හිස් වැසුම් නිකායේ නිර්මාතෘ ත්සොන් කාපා හිමියන් වෙනුවෙනි. පරිවාර ලාමාවරුන්ගේ ප්‍රතිමා 70ක් ද එහි වෙයි. අටවන සියවසේ ඉන්දියාවේ සිට පැමිණි පද්මසම්භව තෙරුන් වහන්සේ වෙනුවෙන් දකුණු පූජා කුටිය වෙන් වී තිබේ. 17 වන සියවසේ නිර්මාණය කරන ලද පද්මසම්භව තෙරුන් වහන්සේගේ රිදී පිළිමය එහි කැපී පෙනෙයි.

පැරණි ධර්ම ග්‍රන්ථ, පට සළු මත අඳින ලද දුර්ලභ චිත්‍ර ආදිය පමණක් නොව පැරණි අවි ආයුධ වර්ග පවා පොටාලා මාළිගයේ තැන්පත් කර තිබේ. ඇතුල් ශාලාවන්හි ලී කණු සියල්ල ඉතා සියුම් කැටයමින් අලංකෘතය.

පොටාලා මාළිගය ආගමික හා සංස්කෘතික කලාගාරයක් ලෙස ද හැඳින්වීම යුක්ති සහගතය. මෙම විස්මිත කලාගාරය නැරඹීම සඳහාත්, වන්දනාමාන කර ගැනීම සඳහාත් දිනපතා ම පාහේ සංචාරකයින් විශාල පිරිසක් ඇදී ආවත් එක් දිනකදී මාළිගය නැරඹීමට අවසර ලබා දෙන්නේ 2300කට පමණි.



ශ්‍රී ලංකාවෙන් ගෙන යන ලද අවලෝකිතේශ්වර පිළිම වහන්සේ අදත් පොටාලා මාළිගයට ආධ්‍යාත්මික ආරක්ෂාව සලසන බවට විශ්වාස කෙරේ. මාළිගය තුළ ඇති රන්, රිදී, ලෝකඩ ආදියෙන් තැනූ ලක්ෂ දෙකකට අධික පිළිම අතරින් වැදගත් ම පිළිමය වශයෙන් ද සැලකෙන්නේ මෙම අවලෝකිතේශ්වර පිළිමයයි.

# චීන සත්ව රාශි ලකුණු දොළහ




සත්ව ලකුණු ලෙස ද හඳුන්වන චීන රාශි ලකුණු යනු වර්ෂ අංකනය කර වයස ගණනය කිරීම සඳහා චීන ජනතාව අතර පවතින සාම්ප්‍රදායික ක්‍රමයකි. චීන භාෂාවෙන් "රාශි" යන්න උපන් වර්ෂය සඳහා යෙදෙන අතර "ලකුණ" යන්න ඒ හා අනුරූප හෝ සමාන සංකේත සඳහා යෙදේ. ලකුණු හෝ සංකේත යනු සතුන් දොළොස් වර්ගයකි. පිළිවෙළින් මීයා, ගොනා, කොටියා, හාවා, මකරා, නයා, අශ්වයා, බැටළුවා, වඳුරා, කුකුළා, බල්ලා සහ ඌරා යනු එම සංකේතයි. ඒවා පෘථිවිය පිළිබඳ ශාඛා දොළහ සමග ගැළපෙයි. ඒ අනුව "ත්සි" මීයා, "චෞ" හරකා, "යින්" කොටියා, "මාඕ" හාවා, "චෙන්" මකරා, "සි" නාගයා, "වූ" අශ්වයා, "වෙයි" බල්ලා, "ෂෙන්" වඳුරා, "යූ" කුකුළා, "සියුයි" බල්ලා සහ "හායි" ඌරා යනුවෙන් දැක්විය හැකිය. මේ ආකාරයෙන් සෑම කෙනෙකුගේම උපන් වර්ෂය යම් ආකාරයක සතෙකු සමග ගැළපේ.

රාශි ලකුණු සංස්කෘතිය, චීන සම්ප්‍රදායික ජන සංස්කෘතියේ වැදගත් අංගයකි. සත්ව ප්‍රතිබිම්බ සෑම අයෙකුගේම ජීවිතය පුරා එක්ව පවතින බැවින්, රාශි ලකුණු හෝ සත්ව ලකුණු පුද්ගලයෙකුගේ උපන් සංකේතය සහ වයස මතක තබා ගැනීමේ පදනම වනවා පමණක් නොව, එය පුද්ගලයෙකුට ඔහුගේ / ඇයගේ ජීවිතය හා බැඳුනු මංගල කරුණ ද වේ. ඒ පිළිබඳව ජනතාව බොහෝ අලංකාර ප්‍රාර්ථනා සහ අධ්‍යාත්මික විශ්වාස දරා හිඳිති.

### රාශි ලකුණු පිළිබඳව ජනප්‍රවාද

චීන ජනයා අතර රාශි ලකුණු දොළහ පිළිබඳව හාස්‍යජනක ජනප්‍රවාද බොහොමයක් ඇත. ඒවා අතුරින් පහත සඳහන් ජනප්‍රවාද දෙක වඩාත්ම ජනප්‍රියය.

### රාශි ලකුණු දොළසෙහි මූලාරම්භය

රාශි ලකුණු දොළසෙහි මූලාරම්භය පිළිබඳව චීනයේ පැතිරුණු සුරංගනා කථාවක් වෙයි. බොහෝ කලකට පෙර එක් දිනක් දේව රජතුමා සියලුම සතුන් කඳවාගෙන තමා ඔවුන්ගෙන් සතුන් වර්ග දොළහක් තෝරා ගන්නවා. ඒ සෑම වර්ගයකටම පෘථිවියෙහි රජකම වසරක කාලයක් බැගින් ලබා දෙනවා. එය රාශි ලකුණු දොළහ බවට පත්වනු ඇතැයි පැවසීය.

මීළඟ චන්ද්‍ර වර්ෂයේ පළමු මාසයේ පළමුවන දින "ගඟ තරණය කිරීමේ තරගයක්" පැවැත්වීමට දේව රජුතුමා සහ සත්තු එකඟ වූහ. සතුන් වර්ග ගඟ හරහා පීනා සිද්ධස්ථානයට ළඟා වූ අනුපිළිවෙල අනුව පිළිවෙලින් මහා පොලොවේ රජු බවට පත් කරන බව ප්‍රකාශ කෙරිණ. "මම පළමු වැන්නා වෙමි." "නැහැ ඔබ නොවේ. මම පළමුවැන්නා වන්නෙමි" ආදී වශයෙන් සතුන් මහ හඬින් වාද කර ගැනීමට පටන් ගත්හ.

ගඟ තරණය කිරීමේ තරගය පැවැත්වෙන දිනය එළඹුණි. සතුන් අන් අයට පෙර සිද්ධස්ථානය වෙත ළඟා වීම සඳහා කල්වේලා ඇතිව ගමනාරම්භ කළහ.

ගඟ තරණය කිරීමේදී සියලුම සතුන් ඉතා තියුණු ලෙස පීනූහ. ඔවුන් අතුරින් ගොනා වේගවත්ම සතා විය. මීයාට පිහිනීමට නොහැකි වීම හේතුවෙන් ඌ තමාව ගෙන යන ලෙස ගොනාට කන්නලව් කළේය.

මදකට පසුව ගොනා වෙරළට ආසන්න විය. කෙසේ වුවත් ඌ පළමුවැන්නා වීමට ආසන්න වන විට ප්‍රයෝගකාර මීයා උගේ පිටෙන් පැන ගොනාට පෙර සිද්ධස්ථානයට ළඟා විය. "මමයි පළමුවැන්නා, මමයි පළමුවැන්නා" මීයා ආඩම්බරයෙන් පැවසීය.

ඉනික්බිතිව අනෙකුත් සතුන් වර්ගද අනුක්‍රමයෙන් ළඟා විය.

එකඟතාවයට අනුව සිද්ධස්ථානය වෙත පළමුව ළඟා වූ සත්ව වර්ගයාට ළඟා වීමේ අනුපිළිවෙල අනුව රජු බවට පත් විය හැකි විය. ඔවුන්ට ඔවුන්ගේ නම් ද එම අනුරූප වර්ෂයේ නම සඳහා භාවිතා වෙයි. අපි මෙය මෙම වසරින් ආරම්භ කරමු.

අනුපිළිවෙළ අනුව එය මීයා, ගොනා, කොටියා, හාවා, මකරා, නයා, අශ්වයා, බැටළුවා, වඳුරා, කුකුළා, බල්ලා සහ ඌරා විය යුතු යැයි දේව රජුතුමා අනුපිළිවෙළ සියලු සතුන්ට නිවේදනය කළහ. එබැවින් මීයා රාශි ලකුණු දොළසෙහි ප්‍රථම ස්ථානයට පත්වූ අතර ගොනාට අකැමැත්තෙන් වුවද දෙවැන්නා වීමට සිදු විය.

## රාශි ලකුණු දොළසෙහි බළලා ඇතුළත් නොවන්නේ ඇයි?

දේව රජතුමා සතුන් වර්ග දොළසෙහි අනුපිළිවෙළ තීරණය කිරීමෙන් පසු ඔහු මීයා ඇතුළත් නොකර අනෙකුත් වර්ග එකොළහ දැනුවත් කිරීම බළලාට භාර කළේය. කෙසේ වුවද මීයාට බළලා සහ ගොනා අතර වූ දෙබස කණ වැකුණි. එබැවින් මීයා ලියාපදිංචි වීම සඳහා රහසින් දිව්‍ය මාළිගාවට ගොස් වාසි ලබා ගැනීමේ ප්‍රථමයා විය. දේව රජුතුමා නම් වට්ටෝරුව ඇණවුම් කරන විට මීයා ප්‍රථමයා බව ඔහු දුටුවේය. සත්‍යය සහ අසත්‍යය වෙන් කොට හඳුනා ගැනීමෙන් තොරව ඔහු මීයාව පළමු තැනට ස්ථානගත කළේය. සැබෑ ප්‍රථමයා දෙවැන්නා විය. බළලා සියල්ලන් දැනුවත් කිරීමෙන් පසු මාළිගයට ළඟා වූ විට ලැයිස්තුවේ ඌට ස්ථානයක් නොමැතිවම සම්පූර්ණ කොට තිබුණි. එබැවින් මීයා රාශි ලකුණු දොළස අතුරින් පළමුවැන්නා බවට පත් වූ අතර බළලා ඇතුළත් නොවීය. එතැන් පටන් බළලා සහ මීයා සතුරන් බවට පත් වූහ. මීයා දිස්වන සෑම විටම බළලා ඌ එළවා ගොස් සපා කන්නේය.



# සිත් බැඳි ගඟ

මේ මහ දිග ගංගාවේ
මම ඉහලයි - ඔබ පහලයි

මේ මහ දිග ගංගාවේ
ගලා බසින මහ ජල කඳ
පවස නිවයි - දෙදෙනාගෙම

හැමදාමත් ඔබ සිහි කර
මම ඉහලයි - ඔබ පහලයි

මේ මහ ගඟ නතර වේ ද?
මගේ දුක් කඳ නිවී යා ද?

මේ මහ දිග ගංගාවේ
මහ ජල කඳ ගලා යාවි
ඉහල පහල යා කරාවි
ඔබේ හදත් - මගේ හදත්
එක තැනකට එක්කරාවි
මහ ජල කඳ ගලා යාවී.



මෙය චීන පෙම් කවියකි. සොං රාජවංශයේ, ලී චී යී නමැති සුළු නිළධාරියෙක් සිටියේය. ඔහු බොහෝම දුක්බර ජීවිතයක් ගත කළේය. ඉහල නිලධාරියෙකුව අමනාප කර ගත් බැවින් ඔහු සේවයෙන් පහළ දමා තිබුණි. ටික කාලයකින්ම, ඔහුගේ බිරිඳ, දියණිය සහ පුතා අසනීප වී මිය ගියහ. ඔහුත් දුක්මුසු රෝගයකින් පෙළෙන්නට වුණි. සියළු බලාපොරොත්තු සුන් වීමට ආසන්න අවස්ථාවකදී, ඔහුට යහපත් කාන්තාවක් මුණ ගැසී ඇය සමග මිත්‍ර සම්බන්ධතාවක් ඇති විය. මෙම කාන්තාව ඉතාමත් රූමත් මෙන්ම කවි නිර්මාණයෙහිද දක්ෂ වූවාය. ඇය ලී චී යීගේ දුක්බර ජීවිතය කෙරෙහි දැඩි අනුකම්පාවක් දැක්වූ අතර ඔහුව නිතරම දිරිමත් කළාය. ලී චී යී ඇයට ආදරය කළේය. වරක් ඒ දෙදෙනා යැන්සී ගඟ ඉවුරේ සුන්දරත්වය නැරඹීමට ගියහ. ගං ඉවුරේ අලංකාර දර්ශනය රස විඳිමින්, තමන්ගේ ජීවන අත්දැකීමෙන් ප්‍රබෝධමත් වී, හැඟුම්බරව ලී චී යී මේ කවිය කියමින් සිය ප්‍රේමය ප්‍රකාශ කළේය. අන්තිමේදී ඔවුන් විවාහ වී සතුටුදායක ජීවිතයක් ගත කළහ. ලී චී යී චීනයේ සුප්‍රකට කවියෙකු ලෙස සැළකේ.

# බෙල්ලා සහ කැස්වටුවාගේ සටනින් ජය කාට ද?

අතීතයේ එක් දිනයක චාඕ රජතුමා යැන් රජයට ප්‍රහාරයක් එල්ල කරන්න සිතුවේය. නමුත් එක් දූරදර්ශී නිලධාරියෙක් එසේ නොකරන ලෙස රජතුමාව කැමති කරවා ගන්න උත්සාහ කළේය.

"මා මෙහි එන අතර මඟදී ගංගාවක් තරණය කළා. ගඟා ඉවුරේ බෙල්ලක් තම කටුව විවෘත කොට ආලෝකය ලබා ගන්නා ආකාරය මම දුටුවා. එවිට කැස්වටුවෙක් කඩිනමින් බෙල්ලා ළඟට දුවලා බෙල්ලාගේ මසට හොටෙන් කොටන්න උත්සාහ කළා. ඒ සමඟම ඒ බෙල්ලා සිය බෙලිකටුව වහා ගත්තා. ඉතින් කැස්වටුවාගේ හොට බෙලිකටුවේ තදින් හිර වුණා. කැස්වටුවා බෙල්ලාට කතා කළේ මේ විදියට. "අද වැස්සේ නැත්නම් හෙටත් වැස්සේ නැත්නම් ඔයා මැරේවි." බෙල්ලා ඒ කතාවට පිළිතුරු දුන්නේ මෙලෙසයි. "අද මා බෙලිකටුව අරින්නේ නැත්නම් හෙටත් අරින්නේ නැත්නම් ඔයත් මැරේවි." ඒ දෙන්නා ඒ විදියට කාටවත් දෙවෙනි වෙන්න කැමති වූයේ නැහැ. එවිට ධීවරයෙක් ආවා. එයා අකර්මන්‍යව සිටි ඒ සතුන් දෙදෙනා දැකලා ලෙහෙසියෙන්ම ඔවුන් අල්ලා ගෙන ගෙදර ගියා. චාඕ රජය යැන් රජයට ප්‍රහාරයක් එල්ල කරනවා නම් අර බෙල්ලා සහ කැස්වටුවා වගේ කරට කර තත්වයක් ඇති වේවි. කල් ගත වීමත් සමඟම දෙරටම හොඳටම හෙම්බත් වේවි. එවිට බලවත් ඡින් අධිරජයා, අර ධීවරයා වගේ කිසිදු ශක්තියක් නොයොදා ඔය රටවල් දෙක ම අත්පත් කර ගනීවි."

ඒ නිලධාරියාගේ කතාවෙන් චාඕ රජතුමාට අවබෝධය ලැබුණි. ඔහු යැන් රජයට ප්‍රහාරය එල්ල කිරීමේ අදහස අත්හැරීය.









# ශ්‍රී ලංකා රතු කුරුස සමාජය හා ප්‍රථමාධාර

1863 දී ඇරඹි ලෝක රතු කුරුස හා රතු අඩසඳ ව්‍යාපාරය අදවන විට රටවල් 189 පුරා මානුෂවාදී මෙහෙවරෙහි නිරතවන විශිෂ්ට ගණයේ මානුෂවාදී ස්වේච්ඡා සංවිධානයක් බවට පත්ව තිබේ. 1930 දශකයේ බ්‍රිතාන්‍ය පාලන සමයේදී ශ්‍රී ලංකාවේ ඇති වූ දරුණු මැලේරියා වසංගතයෙන් විපතට පත්වන දහස් සංඛ්‍යාත රටවැසියාට සහන සැලසීමේ අරමුණින් 1936 දී ඇරඹි ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ද එම සුවිශාල මෙහෙවරෙහි කොටස්කරුවෙකු වෙමින් වසර 75 කට අධික කාලයක් පුරා මෙරට තුළ ප්‍රථමාධාර පුහුණු හා ප්‍රථමාධාර සේවා ඇතුළු විවිධ වූ මානුෂවාදී සේවාවන් තුළින් ජනතාවට සහාය සපයන ප්‍රමුඛතම මානව හිතවාදී සංවිධානයක් බවට පත්ව තිබේ.

දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය කරමින් පිහිටුවා ඇති සිය ශාඛා ජාලය හා ඒහා ඒකාබද්ධ කටයුතු කරන අපගේ තරුණ හා වැඩිහිටි ස්වේච්ඡා සේවක මහත්ම මහත්මීන් මගින් ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මෙරට පවත්වනු ලබන විවිධ පෙරහැර, ජාතික උත්සව, ආපදා හා විශාල වශයෙන් ජනතාව ඒකරාශී වන ස්ථානවල අනතුරට හා රෝගී තත්ත්වයන්ට පත්වන ජනතාවට ප්‍රථමාධාර ලබා දීමේ ස්වේච්ඡා ප්‍රථමාධාර කඳවුරු පවත්වනු ලබයි.

එමෙන්ම මෙම කලාපයේ ප්‍රථමාධාර පාඩමෙන් සාකච්ඡා කොට ඇති පරිදි සෑම දෙනෙකුම ප්‍රථමාධාර දැන සිටීමේ අවශ්‍යතාවය අද වන විට ඉතාමත් ඉහළ ගොස් ඇත. එම නිසා දිස්ත්‍රික්ක 25 පුරාම විවිධ වර්ගයේ ප්‍රථමාධාර පුහුණු පාඨමාලා ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ පුහුණුවලත් ප්‍රථමාධාර උපදේශක මහත්ම මහත්මීන් මගින් පවත්වනු ලබයි.

පාඩම - අංක 01

# ප්‍රථමාධාර හඳුනා ගනිමු



ඉදිරිපත් කිරීම : ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ ප්‍රථමාධාර උපදේශක - ජයබුද්ධි ඥානතිලක

## ප්‍රථමාධාර යනු කුමක්ද?

ප්‍රථමාධාර යනු රෝගී වූ හෝ තුවාලලත් අයෙකුට ප්‍රථමයෙන් දෙනු ලබන ආධාරයයි. එනම් කිසියම් රෝගී අවස්ථාවකදී හෝ හදිසි අනතුරක් සිදු වූ විගස රෝගී වූ හෝ අනතුරට පත්වූ අයට වෛද්‍යාධාර ලබා දෙන තෙක් තාවකාලිකව දෙනු ලබන ප්‍රථම සෞඛ්‍ය සත්කාරයයි. මෙහි ඇති විශේෂත්වය වන්නේ ප්‍රථමාධාර ලබා දීම සඳහා වෛද්‍යමය ආම්පන්න අප ළඟ සෑම විටම තිබීමට අවශ්‍ය නොවීමයි. අවට පරිසරයේ ඇති සුදුසු දේවල් උපයෝගී කරගෙන මෙය ලබා දිය හැකිවා මෙන්ම ප්‍රථමාධාර පිළිබඳ දැනුම හා පුහුණුව ලැබූ ඕනෑම අයෙකුට ඉතා සුළු ක්‍රියාවකින් වුව ප්‍රථමාධාර මෙය ලබා දීමටත් එමගින් ජීවිත රැකගැනීමටත් හැකියාව ලැබේ.

## ප්‍රථමාධාර ලබාදීමේ අරමුණු හා වැදගත්කම

ප්‍රථමාධාර ලබා දීමේ ප්‍රධාන අරමුණු 03 කි. එනම් රෝගීන්ගේ

01. ජීවිත බේරා ගැනීම
02. රෝගී තත්ත්වය උත්සන්න වීම වැළැක්වීම
03. සුවය පහසු කිරීම

නිසි වේලාවේදී ප්‍රථමාධාර නිවැරදිව ලබා දීමෙන් රෝගී අවස්ථාවලදී හා හදිසි අනතුරුවලදී අකාලයේ සිය ජීවිතයෙන් සමු ගැනීමට සිදුවන දහස් ගණනකගේ ජීවිත බේරා ගැනීමට හැකියාව ලැබේ.

සංවර්ධනයේ වේගයත් සමගම දිනෙන් දින වැඩිවෙමින් පවතින හදිසි අනතුරුවලදී බොහෝ විට සිදුවන්නේ එම අනතුරට පත්වූවන්ගේ තත්ත්වය

කුමක් වුවත් ඔවුන්ව රෝහලට ප්‍රවාහනය කිරීම පමණි. නමුත් එසේ ප්‍රවාහනය කරන කාලය තුළ රෝගීන් අසිහි තත්ත්වයෙන් සිටීනම්, ස්වසනය ඇණ හිට තිබේනම්, රුධිර වහනය වෙමින් පවතී නම්, කොඳු ඇට පෙළ හෝ වෙනත් අස්ථීන් කැඩී බිඳී තිබේනම් රෝහලට රැගෙන එනතෙක් ඔවුන්ගේ ජීවිත බේරා ගැනීමටත්, පවත්නා තත්ත්වය උත්සන්න වීම වැළැක්වීම සඳහාත් අපට කළ හැකි දේ බොහෝය. හදිසි අනතුරකින් පසු ස්වසනය නොකරන අයෙකුට රෝහලට රැගෙන එනතෙක් කෘතිම ස්වසනය හා කෘතිම පපු පීඩනය ලබා දීම මගින් ඔවුන්ගේ ජීවිත බේරා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ඇති අතර රුධිර වහනය වන අවස්ථාවකදී එය පාලනය කිරීම මගින් අදාළ රෝගියා කම්පන තත්ත්වයට පත්වීම, අසිහි තත්ත්වයට පත්වීම වැනි උග්‍ර තත්ත්වයකන්ට  රෝගියා පත්වීම වැළැක්වීමට ද හැකියාව ලැබේ.

ශ්‍රී ලංකාවේ රිය අනතුරු මගින් දිනකට සාමාන්‍ය වශයෙන් 06 දෙනෙකුගේ පමණ වටිනා ජීවිත අහිමි වන අතර වාර්ෂිකව දහස් ගණනක් තුවාල ලැබීම් හා දිගුකාලීන දුබලතාවලට ලක්වීම ද සිදුවේ. එමෙන්ම දියේ ගිලීම්, රැකියා ස්ථානවලදී වන අනතුරු, ගෙදරදොරදී හෝ පාසලේදී වන ඇදවැටීම් නිසා සිදුවන ලේ ගැලීම හෝ අස්ථි අනතුරු, වස විෂ ශරීරගතවීම්, සතුන් සපා කෑම් හා දෂ්ට කිරීම්, පිළිස්සීම්, ස්වසන මාර්ගය අවහිර වීම්, විදුලි සැර වැදීම් වැනි විවිධ අනතුරු මෙන්ම, හෘදයාබාධ, ක්ලාන්තය, වලිප්පුව, පාචනය, සිහි නැතිවීම, දියවැඩියාව, ඇදුම වැනි විවිධ රෝගී අවස්ථාද (මෙම අවස්ථාවලදී සිදු කළ යුතු ප්‍රථමාධාර ඉදිරි පාඩම්වලදී ඉගෙනගත හැකිය.) දෛනිකව සෑම ප්‍රදේශයකම පාහේ සිදු වෙමින් පවතී. මෙවන් අවස්ථාවලදී රෝහලට රැගෙන එන තෙක් ප්‍රථමාධාර ලබා දීමට රැස්ව සිටින්නන් හා ප්‍රවාහනය කරන්නන් නොදන්නේ නම් රෝගියාට ජීවිතයෙන් සමුගැනීමට වුවද සිදු විය හැක. සමහර විට රෝගය සුවපත් වීමට අධික කාලයක් ගත වනු ඇත. සමහර විට දිගුකාලීන ආබාධයන්ගෙන් පීඩා විඳීමට ද සිදු වනු ඇත.

මෙමගින් පැහැදිලි වන්නේ අප සෑම දෙනාම ප්‍රථමාධාර දැන සිටීම ඉතාම වැදගත් හා අත්‍යවශ්‍ය ජීවන කුසලතාවයක් වී ඇති බවයි.

## ප්‍රථමාධාරකරුවෙකු වන්නේ කෙසේද?

ඕනෑම අයෙකුට ප්‍රථමාධාරකරුවෙකු විය හැකි අතර ඒ සඳහා අවශ්‍ය වන්නේ කැමැත්ත හා පුහුණු වීමයි. ප්‍රථමාධාරකරුවෙකු ලෙස තමාගේ සමීපතමයන්ටත්, සමාජයටත් වැඩදායී පුද්ගලයෙකු වීම සඳහා වැඩිවර්ධනය කරගත යුතු ගුණාංග කිහිපයකි. ඒ අතර නායකත්වය, රෝගීන්ව පිළිකුල් නොකිරීම හා කාරුණික බව, ආත්ම විශ්වාසය, ස්ථානෝචිත ප්‍රඥාව, ක්‍රියාශීලී බව ආදිය ඉතා වැදගත් වේ.

ප්‍රථමාධාරකරුවා වෛද්‍යවරයෙකු හෝ සියල්ල දත් අයෙකු නොවේ. නමුත් ඉතා වටිනා දැනුමක් හා හැකියාවක් ඇත්තෙකි.



ප්‍රථමාධාර ක්‍රමශිල්ප ඉතා සංකීර්ණ හෝ ගැඹුරු දෙයක් නොවේ. එය ඉතා සරළ, පහසුවෙන් කළ හැකි එනමුත් කිසියම් අයෙකුගේ ජීවිතයක් සම්පූර්ණයෙන් බේරා ගැනීම දක්වා අතිශයින් ඉවහල් වන ඉතා විශිෂ්ට කුසලතාවයක් මේ තුළ ගැබ්ව පවතී. මෙවැනි විධිමත් ප්‍රථමාධාර දැනුමක් හා පුහුණුවක් ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මගින් ද ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව ලබා ගත හැකිය.

## ප්‍රථමාධාරකරුවෙකුගේ වගකීම්

ප්‍රථමාධාර ලබා දීමේදී ප්‍රථමාධාරකරුවෙකු සතුව තිබෙන වගකීම් කිහිපයකි. මෙම වගකීම් ඉතා සරල ක්‍රියාමාර්ග වන අතර එනමුදු ඉතා වැදගත් පියවරයන් වේ.

- ආරක්ෂාව සහතික කිරීම
- තක්සේරුව සිදු කිරීම
- රෝග විනිශ්චය කිරීම
- ප්‍රථමාධාර කිරීම
- පශ්චාත් සංරක්ෂණය
- වාර්තා කිරීම

කිසියම් හදිසි අවස්ථාවකදී ප්‍රථමාධාරකරුවෙකු මුලින්ම සිතිය යුත්තේ තමන්ගේ ආරක්ෂාව පිළිබඳවය. ඒ තමන්ගේ ජීවිතය පළමු කොට ආරක්ෂා කොට ගත යුතු නිසා මෙන්ම තමනුත් එම

අනතුරෙහි ගොදුරක් බවට පත්වුවහොත් තවදුරටත් අනතුරට පත්වූවන්ට ප්‍රථමාධාර කිරීමට තමන්ට නොහැකි වන බැවිනි. එම නිසා විදුලි සැර වැදීම්, බෝම්බ පිපිරීම්, රිය අනතුරු, විෂ වායු ආශ්‍රාහනය වීම්, ගිනි, වෙඩිතැබීම් හෝ කලබලකාරී අවස්ථාවන් වැනි ඕනෑම අවස්ථාවකදී ප්‍රථමාධාරකරුගේ පළමු වගකීම වන්නේ සිය ආරක්ෂාව වෙනුවෙන් ගත යුතු සියලු පියවර වහාම ගැනීමයි. එමෙන්ම රෝගීන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමයි. මෙහිදී අවස්ථානුකූලව අවට සිටින අය දැනුවත් කිරීම, අත්මෙස් පැළඳීම, අදාළ වගකිව යුතු ආයතන වෙත දැනුම්දීම, ආරක්ෂිත උපකරණ හා ක්‍රමවේද අනුගමනය කිරීම වැනි දෑ අදාළ වේ. ගිලන් රථවලට, පොලීසියට හෝ ගිනි නිවීමේ ඒකකයට වැනි ආයතනවලට දැනුම් දීමේදී අදාළ තොරතුරු පැහැදිලිව හා නිවැරදිව ලබා දිය යුතුය. තමන්ගේ නම, දුරකථන අංකය, සිද්ධිය, සිදු වී ඇති ස්ථානය, රෝගීන්ගේ ස්වභාවය, පවත්නා අවදානම් තත්ත්වයන් පිළිබඳව මෙහිදී පැහැදිලිව සන්නිවේදනය කළ යුතුය.

එමෙන්ම ඔබ කළ යුතු වන්නේ අදාළ සිද්ධිය කුමක්ද? තවදුරටත් පවත්නා අවදානම් තත්ත්වයන් මොනවාද? කොපමණ රෝගීන් ප්‍රමාණයක් සිටීද, ඒ කුමන ආකාරයේ රෝගීන්ද යන්න පිළිබඳව ක්ෂණික තක්සේරුවක් ලබා ගැනීමයි.

රෝගීන් අසලට යාම ආරක්ෂිත නම් ඔවුන් අසලට ළඟා වී රෝගී තත්ත්වය කුමක්දැයි හඳුනා ගත යුතුය. එසේ හඳුනාගත් රෝගය හෝ අනතුර අනුව ප්‍රථමාධාර කොට පවත්නා තත්ත්වය උත්සන්න වීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගනිමින්, රෝගීන් රෝහලට ප්‍රවාහනය කිරීම අනතුරුව සිදු කෙරේ. එමෙන්ම එසේ ප්‍රථමාධාර දෙනු ලැබූ රෝගීන් පිළිබඳව නම, ලිපිනය, රෝගී තත්ත්වය, හමු වූ වේලාව, සිදු කළ ප්‍රථමාධාර ආදී තොරතුරු ඇතුළත් වාර්තාවක් තමන් සතුව තබා ගැනීම ඉතාම වැදගත් වේ.

## වහාම ප්‍රථමාධාර ලබා දිය යුතු අවස්ථා

පුද්ගලයෙකුගේ ජීවිතය අහිමි වූ බවට අප බොහෝ දෙනා තහවුරු කරගන්නේ අදාළ පුද්ගලයා හුස්ම නොගැනීම, නාඩි හෙවත් රුධිර සංසරණය සිදු නොවීම ආදී සාධක මතයි. නමුත් කිසියම් හදිසි අවස්ථාවකදී කිසියම් අයෙකුගේ ස්වසනය නතරවීම හෝ නාඩි නතරවීම නිසා ඔහු හෝ ඇය මියගෙ ාස් ඇතැයි ප්‍රථමාධාරකරුවෙකු විසින් තීරණය නොකරයි. ඒ එවන් අවස්ථාවකදී වුවද රෝහලට රැගෙන එනතෙක් කෘතිම ස්වසනය සහ කෘතිම පපු පීඩනය මගින් රුධිර සංසරණය පවත්වා ගත හැකි බැවිනි.

කුමන හේතුවක් නිසා වුවද යම් අයෙකු ජීවිතක්ෂයට පත්වීමේදී සිහිය නැතිවීම, ස්වසනය හා හෘදය නතරවීම සිදුවෙයි. එම නිසා එවැනි අවස්ථා ඉතාම ඉක්මනින් ප්‍රථමාධාර සැපයිය යුතු තත්ත්වයන් වේ. එමෙන්ම අධික ලෙස රුධිර වහනය වීම කම්පන තත්ත්වයට පත්වීමටත් එමගින් සිහිය නැති වීම හා හෘදය අකර්මණ්‍ය වීමටත් හේතු වේ. වස විෂ ශරීරගත වීමද ස්නායු පද්ධතිය අඩපණ වීමටත් එමගින් සිහිය නැතිවීමටත් අවසානයේදී ස්වසනය හා හෘදය නරතවීමටත් සෘජුවම බලපෑ හැකියි. එම නිසා ප්‍රථමාධාරකරුවෙකු ඉතා ඉක්මනින් රෝගීන්ගේ රෝගී තත්ත්වයේ ඇති භයානකකම අනුව ප්‍රථමාධාර ආරම්භ කළ යුතුය. ඉහතින් විස්තර කළ පරිදි එම ප්‍රමුඛතාවය පහත පරිදි වේ.

- ස්වසනය ඇණහිටීම
- අධික රුධිර වහනය
- සිහි නැතිවීම
- වස විෂ ශරීරගත වීම

එමෙන්ම අධික පිළිස්සුම් තුවාල සහිත රෝගීන් කෙරෙහිද විශේෂ අවධානයක් ඉතා ඉක්මනින් ලබා දිය යුතුය.

ඒ අනුව මේ කුමන ආකාරයක හෝ රෝගියෙකුට ප්‍රථමාධාර කිරීමට අපට සිදු වුවහොත් අප විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළක් පවතී. එය රෝගී කළමනාකරණ (Casualty Management) ක්‍රමවේදය යැයි හඳුන්වයි.

## රෝගී කළමනාකරණය ක්‍රමවේදය

කිසියම් රෝගියෙකුට ප්‍රථමාධාර කිරීමට යාමේදී ප්‍රථමාධාරකරු විසින් තම කටයුත්ත ආරම්භයේ සිට අවසානය දක්වා සිදු කළ යුතු ක්‍රියාකාරකම් මෙහිදී ප්‍රධාන වශයෙන් පියවර 04 ක් යටතේ දැක්විය හැකිය.

01. මූලික විනිශ්චය සිදු කිරීම
02. ද්විතීයික විනිශ්චය හෙවත් රෝග විනිශ්චය සිදු කිරීම
03. ප්‍රථමාධාර ලබාදීම
04. රෝගියා වෛද්‍ය ප්‍රතිකාර වෙත ප්‍රවාහනය කිරීම

ප්‍රථමාධාරකරුවෙකු මූලික විනිශ්චය සිදු කළ යුතු අයුරු අපි ලබන කලාපයෙන් සාකච්ඡා කරමු.

# ප්‍රජා සවිබල ගැන්වීමේ ඒකාබද්ධ වැඩසටහන



ශ්‍රී ලංකා රතු කුරුස සමාජය විසින් මුල් අවධියේ අවදානම් අවම කිරීම සඳහා ආපදා කළමනාකරණය, සෞඛ්‍ය හා ආයතනික සංවර්ධනය යන අංශයන් හී වෙන් වෙන් වශයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරුනු අතර එමගින් ප්‍රජාවන් හී පුළුල් ලෙස අවදනම අඩු කිරීම සඳහා අපේක්ෂිත ප්‍රතිඵල ලගා කර ගැනීමට නොහැකි බව පෙනීයන ලදී. ඒ අනුව ආපදා සහන සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදි ඒකාබද්ධ ප්‍රවේශයක අවශ්‍යතාවයන් හඳුනා ගත් අතර 2012 දි මෙම ප්‍රජා සවිබල ගැන්වීමේ ඒකාබද්ධ වැඩසටහන (ප්‍රත්‍යස්ථිතික ප්‍රජාවක් සඳහා ඒකාබද්ධ වැඩසටහන) ආරම්භ කරන ලදි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන වශයෙන් ප්‍රජාව තුල ආපද කළමනාකරණය, සෞඛ්‍ය තත්වයන් හා ජීවන රටාවන් ඉහළ නැංවීම හා ආයතන සංවර්ධනය යන සාධක කෙරෙහි අවධානය යොමු කෙරිනි. ආයතන සංවර්ධනය යටතේ ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ බිම් මට්ටමේ ඒකක දියුණු කිරීම මෙන්ම ප්‍රජා සාමාජිකයන්ගේ සහ ස්වේච්ඡා සේවකයන්ගේ හැකියාවන් සහ ධාරිතාවයන් වර්ධනය ගැනද වඩාත් සැලකිලිමත් විය.

මෙම ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා කොළඹ, මාතර, මන්නාරම, කෑගල්ල, හා බදුල්ල යන දිස්ත්‍රික්ක 5 තෝරා ගත් අතර එක් දිස්ත්‍රික්කයකින් ප්‍රජාවන් 5ක් තෝරා ගන්නා ලදි. පළමු අදියර සාර්ථකත්වය මත තවත් දිස්ත්‍රික්ක 5 තුල මෙම ව්‍යාපෘතිය දියත් කිරිමට හැකි වීම ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ලද ජයග්‍රහණයක් විය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ගාල්ල, රත්නපුර, මාතලේ, පොළොන්නරුව, හා කුරුණෑගල දිස්ත්‍රික්ක සඳහාද ව්‍යාප්ත කිරීමට හැකි විය. මීට අමතරව අදාල දිස්ත්‍රික්කයේ තොරාගත් පැසැල් 05ක් තුල මෙම ව්‍යාපෘතිය පාසැල් මට්ටමින් ක්‍රියාත්මක වේ. දැනට පැසැල් 25 තුල සාර්ථක ලෙස මෙම ව්‍යාපෘතිය නිම කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා අන්තර්ජාතික රතු කුරුස සමාජය විසින් මූල්‍ය දයකත්වය සපයනු ලබයි.

ප්‍රජාවන් තෝරා ගැනිම් සඳහා අදූල නිර්නායකයන් ලෙස ආපදවන්ට ගොදුරු වීමට ඇති ඉහළ හැකියාව හා සෞඛ්‍ය අවදානම සලකන ලදි. දැනට දිස්ත්‍රික්ක 10ක තුල ප්‍රජාවන් 50ක මෙම ව්‍යපෘතිය ක්‍රියාත්මක වන අතර ඉන් දිස්ත්‍රික්ක 05කින් තෝරා ගත් ප්‍රජාවන් 25ක මේවන විට ව්‍යාපෘති අවසන් කර ඇත.

මෙම ප්‍රජා සවිබල ගැන්වීමේ ඒකාබද්ධ වැඩසටහනේ අපේක්ෂිත ප්‍රථිපල වනුයේ,

1. ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ ධාරිතාව ඉහල නැංවීම තුලින් ප්‍රජාමූල ප්‍රවේශයන් හරහා ස්වාභාවික හා මිනිසා විසින් නිර්මිත අපදා, ආහාර සුරැක්ෂිත තාවය නොමැති බව, පිරිහෙන ස්වස්ථතාවය, ප්‍රමාණවත් නොවන ජල හා සනීපාරක්ෂක පහසුකම් හා වසන්ගත රෝග වැනි අවදානම් වලට ගොදුරුවීමේ හැකියාව ඇති ප්‍රජාවන් ඊට එරෙහිව පහසුවෙන් යථාතත්වයට පත්වනනා වු සුරක්ෂිත වුත් ප්‍රජාවක් බවට උසස් වීම.
2. සමාජ ආර්ථික හෝ සෞඛ්‍යමය වෙනස් වීම් වලට හා ස්වාභාවික පරිසරයේ හෝ නිර්මිත පරිසරයේ ඇති වන වෙනස්වීම් වලට මුහුණ දිය හැකි වුවද, ඊට ඔරොත්තු දෙමින්, එහි ප්‍රති විපාක සීමා කර ගනිමින්, නැවත ප්‍රකෘති තත්වයට පත්විය හැකි ප්‍රජාවක් ගොඩ නැංවීමයි. එසේ ගොඩ නගා ගත හැකි ප්‍රජා නායකත්වයක් ඇති කිරීම තුලින් ව්‍යාපෘතියේ තිරසාර භාවය තහවුරු කිරීම හා ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ සේවාන්හි ගුණානාත්මක බව ඉහල යන පරිදි නායකත්වය හා ආයතනික ශක්තිතාවය ගොඩනැංවීම.

ව්‍යාපෘතියේ අදියරයන් දෙකෙහිදී ම ප්‍රතිලාභින් ලෙස පවුල් 23,048ද, පුද්ගලයින් 115,240ද, පාසල් ළමුන් 28,524 හා විවිධ කුසලතා වලින් පිරි ස්වේච්ඡා සේවකයින් 500වෙත යොමුවීමට හැකි විය.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදි ආපදා කළමනාකරණ අමාත්‍යංශය, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යංශය, සෞඛ්‍ය අමාත්‍යංශය හා අධ්‍යාපන අමාත්‍යංශය සමඟ කටයුතු කරන අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ සහය මේ සඳහා ලබාගත හැකි විය.

මෙම ව්‍යාපෘතිය පියවර කිහිපයක් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. පළමු පියවර ලෙස තෝරාගත් දිස්ත්‍රික්කයන්හි ශ්‍රී ලංකා රතු කුරුස සමාජ ශාඛා කාර්යාලය සහ අදාල පාර්ශව කරුවන් සඳහා මූලික හඳුන්වා දීමේ වැඩසටහනක්ද, දෙවනුව අපදාවලට ගොදුරු වීමට වඩාත් ඉඩ ඇති ප්‍රජාවන් 05 ක් සහ පාසැල් 05 ක් දෙනු ලබන නිර්ණායකයන් අනුව අදූල දිස්ත්‍රික් ශාඛා මඟින් තෝරා ගනු ලැබේ. 3 වන පියවර ලෙස තෝරාගත් ප්‍රජාවන් සඳහා ප්‍රජා සජීවී කරන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මූලික දත්ත සමික්ෂණය සහ ගොදුරු වීමට ඇති ඉඩ කඩ හා ධාරිතා තක්සේරුව තුලින් ප්‍රදේශයේ ඇති අවදානම් සහ සම්පත් ප්‍රජා සහභාගිත්වයෙන් හඳුනාගනු ලැබීම හතරවන පියවරේ දීද, පස්වන පියවරේදි අවදානම් තත්වයන් අවම කිරිම සදහා ප්‍රජා සැලසුම් සකස් කිරීමද කරනු ලබයි. සැලසුම් සකස් කිරීමේදී පහත සඳහන් අංශයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලබයි.

- ආපද අවම කිරීම (ගොදුරු වීමට ඇති ඉඩකඩ හා ධාරිතා තක්සෙරු වාර්ථා පදනම් කර ගනිමින් අදූල ප්‍රජාව තුල සිදු කළ හැකි ආපද අවම කිරීමේ ප්‍රජා ව්‍යාපෘති හඳුනා ගැනීම.)
- ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්
- ධාරිතා වර්ධන වැඩසටහන් ඇතුලත් වේ.

ගොදුරු වීමට ඇති ඉඩකඩ හා ධාරිතා තක්සෙරු ක්‍රියාවලියේ සොයා ගැනීම් අනුව අදළ ප්‍රජාව තුල එක් ආපද අවම කිරිමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ අනුව තොරාගත් ප්‍රජාවන් 50ක් තුල ව්‍යාපෘති 75ක් නිම කිරිමට සැලසුම් කර ඇති අතර මේ වන විට 50කට අධික ව්‍යාපෘති සංඛ්‍යාවක් නිමකර එය ප්‍රජා අයිතියට පවරා දී ඇත. මෙහිදි සඳහන් කල යුතු වැදගත් කරුණ වනුයේ මේ සඳහා ලබා දෙනු ලැබූ ප්‍රජා සහභාගිත්වයයි. අවශ්‍ය මූලික මුල්‍ය, ද්‍රව්‍යමය හා තාක්ෂණික සහය ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මඟින් ලබාදෙන අතර ශ්‍රම දායකත්වය හා ඇතැම් ව්‍යාපෘති සඳහා හිඟ මුල්‍ය සම්පත් ප්‍රජාව මඟින් සපයා දීම තුලින්, මෙම ව්‍යාපෘතිය ඔවුන්ගේ ව්‍යාපෘතියක් වශයෙන් සැලකිමට ප්‍රජාව උත්සුකු වී ඇත. මෙම තත්වය ව්‍යාපෘතියේ ඉදිරි නඩත්තු කිරීමේ කටයුතු සඳහා

මෙන්ම තිරසාර පැවැත්මටද බොහෝ ඉවහල් වේ.

තෝරාගත් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති විවිධ කාණ්ඩ වලට අයත් වන අතර ඒවා පහත සඳහන් වගුවේ පරිදි වේ. එහි අදාල කාණ්ඩයේ ව්‍යාපෘති ගණන හා එහි මුළු ප්‍රතිලාභින් ගණන දක්වා ඇත.

| | ක්‍රියාත්මක අංශ | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිලාභින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ප්‍රජා ජල පහසුකම් සැපයීම (නව ළිං ඉදි කිරීම, ජල පවිත්‍රීකරණය හා ජලය බෙද හැරීමේ (ජල ටැංකි) ස්ථාන ඉදි කිරීම | 17 | 26470 |
| 02 | සනීපාරක්ෂක පහසුකම් ලබාදීම හා වැසිකිලි ඉදි කිරීම | 13 | 9145 |
| 03 | ප්‍රජා ශාලා ඉදි කිරීම (මෙම ශාලා ආරක්ෂක මධ්‍යස්ථාන හා ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථාන ලෙසද භාවිතා කරයි.) | 14 | 21830 |
| 04 | ආරක්ෂිත ඉවත් කිරීමේ මාර්ග සැකසීම | 07 | 7440 |
| 05 | ගං ඉවුරු සැකසීම හා ජල පවාහන මාර්ග ඉදි කිරීම. | 05 | 7625 |
| 06 | ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම සඳහා සහය දැක්වීම (තාක්ෂණික සහය සහ උපකරණ ලබා දීම) | 02 | 635 |
| 07 | ආපදා පෙර සූදානම් සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම | 13 | 12500 |

මීට අමතරව පෝෂණ තත්වයන් ඉහල නැංවීම සඳහා පෝෂණ අධ්‍යාපන වැඩ සටහන්ද ගෙවතු වගා වැඩසටහන් තුලින් මන්දපෝෂණය අවම කිරීම සඳහා දායකත්වයක්ද, එසේම ස්වස්ථිතිකතාවය ඉහල නැංවීම සඳහා අවශ්‍ය දැනුවත්වීමේ වැඩසටහන්ද මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වේ.

ඩෙංගු, බෝ නොවන රෝග, මත්ද්‍රව්‍යය හා දුම්කොල භාවිතය, වසංගත රෝග පාලනය, ලිංගිකව සම්ප්‍රේෂනය වන රෝග හා ඒඩ්ස් වැනි රෝග සම්බන්ධව ප්‍රජාව තුල ඇති දැනුම ඉහල නැංවීමේ අරමුණින් මෙම කරුණු ආවරණය වන පරිද්දෙන් විවිධ අධ්‍යාපන දැනුවත් කිරීමේ වැඩසටහන ප්‍රජාව තුල ක්‍රියාත්මක කරනු ලබයි. මෙහි දී අදාල දිස්ත්‍රික්කයේ රෝහල්, වෛද්‍යවරුන් හා සෞඛ්‍ය නිළධාරින් සහයෝගය උපරිම අන්දමින් ලබා ගැනිමට ශ්‍රී ලංකා රතු කුරුස සංගමයට හැකි වී ඇත. තවද දේශගුණික විපර්යාසයන් සහ එහි බලපෑම සම්බන්ධයෙන් ප්‍රජාව දැවුවත් කිරීමේ වැඩසටහන්ද ක්‍රියාත්මක කෙරුණි.

ප්‍රජා සමාජිකයන්ගේ කුසලතාවයන්, හැකියාවන් හා ධාරිතාවයන් දියුණු කිරීමේ, නායකත්ව, යහපාලනය හා කළමනාකරණ පුහුණු හා ප්‍රථමාධාර පුහුණු වැඩසටහන් මෙන්ම ආපදාවකදී කටයුතු කලයුතු ආකාරය ගැනද ප්‍රායෝගික දැනුමක් ලබා මෙම ව්‍යාපෘතියෙන් ප්‍රජාව වෙත දෙනු ලැබේ. ආපදවකදී සෙවීම් හා මුදවා ගැනිම්, කඳවුරු කළමනාකරණය, පෙර දැනුම් දීමේ සහ පෙරහුරු වැඩසටහන් එම ක්‍රියාකාරම් අතරින් කිහිපයක් වේ.

අදාල ප්‍රජා සමාජිකයන්ගේ ජීවන මට්ටම ඉහල නැංවීමේ අරමුණින් ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කර ගැනිමට අවශ්‍ය තාක්ෂණික පුහුණුව හා ඇතැම් විට උපකරණ කට්ටලද මෙම ව්‍යාපෘතිය යටතේ සපයා දෙනු ලැබේ.

ප්‍රජා වැඩසටහන් වලට සමගාමීව එක් එක් දිස්ත්‍රික්කයෙන් තෝරාගත් පාසැල් 05ක් තුල පාසැල් අපදා ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර මෙම වැඩසටහන් අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ණ අනුමැතිය ඇතිව ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි.

අදාල දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන නිළධාරින්, තෝරාගත් පාසැල් වල විදුහල්පතිවරුන් සඳහා මෙම ව්‍යාපෘතිය හඳුන්වා දීමේ වැඩසටහනින් අනතුරුව අදල පාසැල් තුල මෙම හඳුන්වා දීමේ වැඩසටහන් සිදු කරනු ලබයි. තෙවනුව තෝරාගත් පාසැල් වලින් ගුරුවරු දෙදෙනෙකු සඳහා දීර්ඝ වශයෙන් මෙම වැඩසටහන හඳුන්වාදීම සඳහා දෙදිනක වැඩමුළුවක් පවත්වනු ලැබේ. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිළධාරීන්ද සම්බන්ධ කරගනු ලබයි.

මේ යටතේ ගුරුවර ගුරුවරියන් 98 දෙනෙකු සඳහා වැඩමුළු 4ක් පවත්වා ඇත. අනතුරුව පාසැල් තුල ගොදුරු වීමට ඇති ඉඩකඩ හා ධාරිතා තක්සේරුවක් සිදු කර වාර්ථාවක් හා සැලසුම් සකස් කරනු ලැබේ. මේ වන විට තෝරාගත් පාසැල් 50න් 40කට අධික සංඛ්‍යාවක් එම වාර්ථා හා සැලසුම් සකස් කර ඇති අතර අනෙක් ඒවා නිම වෙමින් පවතී.

මීට අමතරව පාසැල තුල ආපදා ආරක්ෂණ කණ්ඩායම් (ප්‍රථමාධාර, අනතුරු ඇඟවීමේ කණ්ඩායම් හා ඉවත් කිරීමේ කණ්ඩායම්) පිහිටුවා ඇති අතර හදිසි ආපදාවකදී ඒ සඳහා මුහුණ දියයුතු ආකාරය ගැන අවබෝධයක් ලබා දීම සඳහා පාසැල් තුළ පෙරහුරු ගණනාවක් පවත් වා ඇත.

ඊට අමතරව පාසැල් තුල ප්‍රථමාධාර ඒකක, මාර්ග ආරක්ෂාව පිළිබඳ ඒකකයන්ද පිහිටුවා ඇත. ඉහළ ශ්‍රේණි වල සිසුන් සඳහා දුම්වැටි හා මත්පැන් නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ලිංගාශ්‍රිත බෝවන රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත් වනු ලැබේ. එමෙන්ම පාසැල් දරුවන් සඳහා ආපදා අවම කිරීම මාතෘකාව කර ගනිමින් විවිධ තරගද මෙම ව්‍යාපෘතිය යටතේ පවත්වනු ලබයි.

මෙහිදී විශේෂයෙන් සඳහන් කලයුතු වන්නේ පාසැල තුල ඇති හඳුනාගත් ආපදා අවම කිරීම සඳහා කුඩා පරිමාණයේ ව්‍යාපෘති සඳහා මූල්‍ය සහයෝගයක් මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රධානය කිරීමට හැකිවීමයි. මෙහිදී ප්‍රධාන වශයෙන් පාසැල තුල ප්‍රථමාධාර ඒකක පිහිටුවා අදාල උපකරණ ලබා දීමට කටයුතු කර ඇත.

පාසැල් තුල ආපදා අවම කිරිම උදෙසා ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති පහත වගුවෙන් දක්වා ඇත. එහි ව්‍යාපෘති ගණන හා එහි මුලු ප්‍රතිලාභී ශිෂ්‍ය සංඛ්‍යාව දක්වා ඇත.

| | ක්‍රියාත්මක අංශ | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිලාභින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ප්‍රථමාධාර ඒකක පිහිටුවීම | 23 | 26470 |
| 02 | ආරක්ෂක බැමි සහ වැටවල් සැකසීම | 04 | 9145 |
| 03 | අනාරක්ෂිත ගොඩනැගිලි හා විදුලි රැහැන් පද්ධති අලුත් වැඩියා කිරීම | 05 | 21830 |
| 04 | අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවර්ධනය කිරීම | 03 | 7440 |
| 05 | සනීපාරක්ෂක ක්‍රම වැඩි දියුණු කිරීම | 02 | 7625 |
| 06 | ජල ප්‍රවාහන ක්‍රම වැඩි දියුණු කිරීම | 01 | 635 |
| 07 | ජල සම්පාදනය | 01 | 12500 |

මෙයට අමතරව ශ්‍රී ලංකා රතු කුරුස සමාජය විසින් දීපව්‍යාප්තව පාසැල් තුල පවත්වන ලැබූ පරිසර සංරක්ෂණ වැඩසටහන් සහ ජාතික පැළ සිටුවීමේ වැඩසටහන් සඳහා විශාල දායකත්වයක් මෙම ව්‍යාපෘතිය තුලින් ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල වූ, ස්වාභාවික හා මිනිසා විසින් ඇති කරනු ලැබූ ආපදාවන් වලදී, ඊට ඔරොත්තු දෙමින් ප්‍රතිවිපාක සීමාකර ගනිමින්, නැවත ප්‍රකෘති තත්ත්වයට පත්විය හැකි ප්‍රජාවන් ගොඩනැංවීමට සැලකිය යුතු මට්ටමෙන් දායකත්වයක් මේ වන විට ලබා දීමට අපට හැකි වූ බව සතුටින් ප්‍රකාශ කරමු. මෙම ව්‍යාපෘතිය තවදුරටත් වෙනත් ප්‍රජාවන් සඳහා ද ව්‍යාප්ත කරමින් එම ප්‍රජාවන් ප්‍රත්‍යස්ථතික ප්‍රජාවන් බවට පත් කිරීම අපගේ අරමුණයි.




# බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලය

ප්‍රධාන දොරටුව

මෑත වසරවල අධ්‍යාපනය ලබා ගැනීමේ අරමුණින් චීනයට එන ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වෙනවා. තාක්ෂණය, වෛද්‍ය විද්‍යාව, බුදු දහම සහ චීන භාෂාව ආදිය ලාංකිකයන් චීන විශ්ව විද්‍යාලවලදී වඩා වැඩියෙන් අධ්‍යයනය කරන විෂයන්.

දැන් චීනයේ බොහෝ ප්‍රදේශවල විශ්ව විද්‍යාලවල ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන් දක්නට ලැබෙනවා. හැබැයි දැන් සඳහන් කරන්න සූදානම් වන මේ විශ්ව විද්‍යාලය සුවිශේෂී එකක්. මෙය ලාංකිකයන්ගේ අවධානයට තවමත් ලක් වී නැහැ. ඒ උණාට චීනයේ අනෙකුත් විශ්ව විද්‍යාලවලට සාපේක්ෂව, මේ විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාව සමඟ වඩා සමීප සබඳතාවක් පවතින එකක්. මොක ද, මෙහි සිංහල අංශයක් තිබෙනවා. ඒ විතරක් නෙමෙයි, මේ විශ්ව විද්‍යාලය දැනට සිංහල භාෂාව ඉගැන්වීමේ එකම චීන විශ්ව විද්‍යාලය. මේ තමයි බෙයිජිං නගරයේ පිහිටි බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලය.

අපේ චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ වැඩ කරන චීන ජාතිකයන්ගෙන් බහුතරය මේ බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයේ සිංහල අංශයේ උපාධිධාරීන්. උදාහරණ වශයෙන් සඳහන් කළොත් සිංහල සේවයේ හිටපු අධ්‍යක්ෂ වං සියඕ තුං මහතා, දැනට අධ්‍යක්ෂකවරිය ලෙස කටයුතු කරන ෂෙං ලී මහත්මිය වගේම ෂාඕ ජී යං, ලියු හුයි වැනි අය ඒ විශ්ව විද්‍යාලයේ ආදි ශිෂ්‍යයන්. ඒ නිසා, මේ බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයේ සිංහල අංශය නැතිනම්, වත්මන් චීනයේ සිංහල විකාශය පවතින්නේ නැහැ කියලා කිව්වොත් අසාධාරණ නැහැ.

සිංහල සේවයේ, ෂාඕ ජී යං සඳහන් කරනවා බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයට ඉතා ප්‍රකට කීර්ති නාමයක් හිමි වන බව. ඒ විශ්ව විද්‍යාලය චීනයේ විදේශ කටයුතු පිළිබඳ නිලධාරින්ගේ තොටිල්ලක් ලෙසින් හැඳින්විය හැකි කියන එක. මොක ද චීනයේ තිබෙන වඩාත් ම වැඩි විදෙස් භාෂාවන් සංඛ්‍යාවක් ඉගැන්වීමේ විශ්ව විද්‍යාලය වන බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන් අතර, චීනයේ ඒ ඒ අමාත්‍යාංශවල ඇමතිවරුන් සහ උප ඇමතිවරුන් සියයකට ආසන්න පිරිසක් සිටිනවා.

විදේශ කටයුතු ක්ෂේත්‍රයේ ප්‍රවීණයින්ට අමතරව, රටේ වෙනත් ක්ෂේත්‍ර රැසක විශිෂ්ඨයන් රාශියකුත් බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයේ ආදි ශිෂ්‍යයන්. ඒ අතර, නොබෙල් සාහිත්‍ය ත්‍යාගය ලැබූ පුද්ගලයෙක් ද සිටිනවා. තව ද, චීනයේ ප්‍රධානම පුවත් ඒජන්සිය වන ෂින්හුවා පුවත් ඒජන්සියේ

වාර්තාකරුවන්, සංස්කාරකවරුන් බොහොමයක් මෙන්ම, එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි චීන රජයට සේවය කරන පරිවර්තකයන් වැනි පුද්ගලයන් රාශියකුත් මේ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලත් අය.

දැනට බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයේ විදෙස් භාෂා 54ක් උගන්නනු ලබනවා. වසර 2020 වන විට, එහි සංඛ්‍යාව 90ක් දක්වා වර්ධනය කිරීමට විශ්ව විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සැලසුම් කර තිබෙනවා.

කෙසේ නමුත්, වසර 1941දී පිහිටුවනු ලබන බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලය හුදෙක් විදෙස් භාෂා පුහුණු කරන විශ්ව විද්‍යාලයක් පමණක් ම නොමෙයි. විදෙස් භාෂා පීඨයට අමතරව, ව්‍යාපාරික කළමනාකරණ පීඨය, නීති පීඨය, පුවත් පීඨය සහ විදේශීය ශිෂ්‍යයන්ට චීන භාෂාව ඉගැන්වීම අරමුණු කර ගන්නා චීන භාෂා පීඨය වැනි පීඨ 14ක් ද එහි ස්ථාපිත කර තිබෙනවා.

දැන්, බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයේ සිංහල අංශය පිළිබඳ අපූරු තොරතුරු රාශියක් ඔබට තිළිණ කරන්නම්. විශ්ව විද්‍යාලයේ තිබෙන විදෙස් භාෂා අංශ 54ක් අතර එකක් වන සිංහල අංශය පිහිටුවනු ලැබුවේ වසර 1961දී. එහි උපත චීනයේ හිටපු අග්‍රාමාත්‍ය චෞ එන් ලායි මහතා සමග සමීප ව සම්බන්ධයි. මොක ද, වසර 1959දී චෞ එන් ලායි අගමැතිතුමාගේ උපදෙස් අනුව, සිංහල අංශයේ ආරම්භකයා ලෙස සැළකෙන චෙන් යූ චොං මහතා සිංහල භාෂාව අධ්‍යයනය කරන්න ශ්‍රී ලංකාවට ගියා. වසර 1961දී චෙන් යූ චොං මහතාගේ සහභාගිත්වයෙන් සිංහල භාෂාව ඉගැන්වීමේ අංශයක් බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයේ ස්ථාපිත කෙරුණා.

විශ්ව විද්‍යාලයේ දර්ශනයක්



අඩසියවසකට වැඩි කාලයක් තුළදී, සිංහල අංශය උපාධිධාරීන් බොහෝ පිරිසක් පෝෂණ කර තිබෙනවා. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් චීනයේ විදේශ කටයුතු, අධ්‍යාපන සහ වෙළෙඳ ගනුදෙනු පිළිබඳ ආයතන මෙන්ම, අපේ චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය වැනි මාධ්‍ය සහ ශ්‍රී ලංකාවේ ආයෝජන කටයුතුවල නිරත වන චීන සමාගම් වැනි ආයතන රැසක සේවා කරන පුද්ගලයන්. ඔවුන් අතර, චීනයේ සිංහල අධ්‍යාපනයේ ආරම්භකයා වන චෙන් යූ චොං මහතා ද සිටිනවා. තව ද, ශ්‍රී ලාංකිකයන් බොහෝ දෙනෙක් හොඳින් හඳුනන සබරගමුව විශ්ව විද්‍යාලයේ ආචාර්ය හාඕ වෙයි මෙන් මහතා සහ ශ්‍රී ලංකාවේ හිටපු චීන තානාපති ජ්‍යාං චින් චැන් මහතා ද සිංහල අංශයේ ආදි ශිෂ්‍යයන්. එමෙන් ම, අපේ චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ වං සියඕ තුං මහතා සහ ෂෙං ලී මහත්මිය ද බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන්. ඒ අය චීනය සහ ශ්‍රී ලංකාව අතර මිත්‍රත්වය සහ සංස්කෘතික හුවමාරු වෙනුවෙන් කැපී පෙනෙන දායකත්වයක් ලබා දෙනවා.

මෑත ඉතිහාසයේ, චීනය සහ ශ්‍රී ලංකාව අතර මිතුදම තව තවත් තහවුරු වී තිබෙනවා. එවැනි පසුබිමක් යටතේ, ශ්‍රී ලංකාව පිළිබඳව වඩා පරිපූර්ණ අවබෝධයක් ලැබීම සඳහා වසර 2011 අගෝස්තු මස ශ්‍රී ලංකා පර්යේෂණ මධ්‍යස්ථානය බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයෙහි ස්ථාපිත කෙරුණා. එහි සමාරම්භක උත්සවය චීනයේ සංචාරයකට පැමිණි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සහභාගිත්වයෙන් පැවැත්වුණා. ඒ මධ්‍යස්ථානය චීනයේ තිබෙන ශ්‍රී ලංකාව පිළිබඳව පර්යේෂණ කරන පළමු ආයතනය ලෙස සැළකෙනවා. ඒ මධ්‍යස්ථානයේ පර්යේෂණ කටයුතුවලට දායක වෙන්න වගේම එහි සිංහල අංශයේ ඉගැන්වීමේ කටයුතු සඳහා එක් වෙන්නැයි බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලය ශ්‍රී ලාංකිකයන්ගෙන් දැඩි ලෙස බලාපොරොත්තු වෙනවා.

චීනය සහ ශ්‍රී ලංකාව අතර සබඳතා සමීප වීමත් සමගම, දෙරට අතර විවිධ ක්ෂේත්‍රවල සහයෝගිතා සඳහා රටවල් දෙකේ ම භාෂාව හා සංස්කෘතිය ගැන අවබෝධයක් තිබෙන පුද්ගලයන් අත්‍යවශ්‍යයි. ඒ නිසා, දැන් සිංහල භාෂාව අධ්‍යයනය කරන චීන ශිෂ්‍යයන් වැඩි වන අතරතුර, චීන බස කෙරෙහි රුචිය දක්වන ලාංකිකයනුත් වැඩි වෙමින් පවතිනවා.

ඒ හේතුවෙන් චීනයේ තිබෙන විදේශිකයන්ට

චීන භාෂාව හා චීන සංස්කෘතිය ඉගැන්වීමේ පළමු විශ්ව විද්‍යාලය වශයෙන්, බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලය බොහෝ ලාංකික ශිෂ්‍යයන්ගේ කදිම තේරීමක් වෙන්න පුළුවන්. පසුගිය සියවසේ 50 දශකයේ සිට ම විදේශිකයන්ට චීන බස ඉගැන්වූ නිසා, බෙයිජිං විදෙස් භාෂ විශ්ව විද්‍යාලයට ඉතා හරවත් අත්දැකීම් රැසක් තියෙනවා. දැන් එහි චීන භාෂා පීඨයේ කාර්ය මණ්ඩලය තුළ ආචාර්යවරුන් 10දෙනෙක්, උප ආචාර්යවරුන් 38දෙනෙක් ඇතුළු ගුරුවරුන් 60කට වැඩි පිරිසක් සිටිනවා.

වසර 2011 වන විට, ඇමෙරිකාව, යුරෝපා රටවල්, ජපානය හා දකුණු කොරියාව වැනි රටවල ශිෂ්‍යයන් දසදාහකට ආසන්න පිරිසක් බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබා තිබෙනවා. එම වසර තුළදී, එහි ඉගෙනීම් කටයුතුවල නියැළෙන විදේශ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව 3500කට වඩා වැඩි වුණා. ඔවුන්ට එහිදී උපාධිය සහ පශ්චාත් උපාධිය පිළිබඳ අධ්‍යාපනය මෙන්ම කෙටිකාලීන පුහුණු වැනි අධ්‍යාපන ද ලබා ගන්න පුළුවන්.

කදිම ඉගැන්වීම් කටයුතු මෙන්ම, බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයේ යටිතල පහසුකම් ද යහපත් මට්ටමක පවතිනවා. එහි චීනයේ ලස්සණම පුස්තකාලයක් තිබෙනවා. තව ද, විදෙස් භාෂා පොත්පත් සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිෂ්පාදන ප්‍රකාශනය කරන චීනයේ විශාලතම ප්‍රකාශන ඒකකය එහි තිබෙනවා. එහිදී විදෙස් භාෂාවට පරිවර්තනය වූ චීනය පිළිබඳ පොත්පත් රාශියක් තිබෙනවා. ඊට අමතරව, ක්‍රීඩා පිටි සහ විවිධ ක්‍රීඩා ඉසව් සඳහා වන ක්‍රීඩාංගන බොහොමයක් ද ඒ විශ්ව විද්‍යාලයෙහි ස්ථාපිත කර තිබෙනවා. ඒ විතරක් නෙමෙයි, විදේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා වන පරිපූර්ණ පහසුකම්වලින් යුත් නේවාසිකාගාරයක් ද එහි ඉදි කර තිබෙනවා.

ඇත්ත වශයෙන්ම, චීනයේ සීඝ්‍ර වර්ධනයත් සමඟ චීනයේ විශ්ව විද්‍යාලවල යටිතල පහසුකම් ද මෑත ඉතිහාසය තුළදී සීඝ්‍රයෙන් දියුණු වී තිබෙනවා. බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවක් මෙන්ම චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ සේවිකාවක් වන ලියු හුයි තම විශ්ව විද්‍යාලයේ පහසුකම් ක්ෂේත්‍රයේ දියුණුව පිළිබඳව මෙසේ කීවා. "වසර 2000දී මම බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයට ඇතුළු වුණා. ඒ කාලයට වඩා දැන් විශ්ව විද්‍යාලය හොඳට වෙනස් වෙලා, දියුණු වෙලා. එහි පහසුකම් සම්පූර්ණයෙන් දියුණු වෙලා. මම එතැනට යන හැම අවස්ථාවකදී ම සතුටක් සහ මවිතයක් මට දැනෙනවා. මොක ද ඒ හැම විට ම අනපේක්ෂිත සුන්දරත්වය, අලුත් ගොඩනැගිලි මට දකින්න ලැබුණා. ඇත්ත වශයෙන් ම අද දවසේ ශිෂ්‍යයන් ඉතාමත් වාසනාවත්තයි."

එහෙනම්, ඔබත් එන්න බෙයිජිං විදෙස් භාෂා විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනයට එක් වන්න. ඒ සඳහා එහි අධ්‍යක්ෂ මණ්ඩලය විතරක් නෙමෙයි, අපිත් ඔබට අවංක සිතින් ආරාධනා කරනවා. ඊට ඔබ කැමැත්තක් දක්වන්නේ නම් විශ්ව විද්‍යාලයේ විස්තරාත්මක තොරතුරු බලන්න පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසෙන්න පුළුවන්. www.bfsu.edu.cn




පුස්තකාලය

# චීන ඔලිම්පික් සිහිනයේ පුරෝගාමියා

2008 වසරේ අගෝස්තු මාසයේ 8 වෙනිදා සිට අගෝස්තු 29 දා දක්වා කාලය චීන ඉතියාසයේ රන් අකුරින් ලියැවුන කාල පරිච්ඡේදයක් බවට පත් විය. "එකම ලොව එකම සිහිනය" යන්න තේමා කරගත් 29 වෙනි ඔලිම්පික් ක්‍රීඩා උළෙල චීනයේ බෙයිජිං නගරයේ පැවැත් වීම එයට හේතුවකි. එහිදී රන් පදක්කම් 51ක්, රිදී පදක්කම් 21ක් සහ ලෝකඩ පදක්කම් 28ක් ලෙසින් ජයග්‍රාහී පදක්කම් 100ක් දිනාගත් චීනය ක්‍රීඩා ලෝකයේ ප්‍රථම ස්ථානයට පත්විය. පිළිවෙළින් ඇමෙරිකාව, රුසියාව සහ බ්‍රිතාන්‍යය චීනයට පිටුපසින් දෙවන, තුනවන සහ සිව්වන ස්ථාන හිමි කරගෙන තිබිණ. එය දීර්ඝ කාලයක් චීන ජාතිකයින් දුටු ඔලිම්පික් සිහිනය යථාර්තයක් බවට පත්වූ ස්වර්ණමය අවස්ථාවක් ලෙස ඉතිහාසයට එක් විය.

මේ ඔලිම්පික් සිහිනයේ මුල්ම හිමිකරුවා වූයේ "ලියු චන් චුන්". ඔහු ඔලිම්පික් ක්‍රීඩා උළෙලක් නියෝජනය කළ මුල්ම චීන ජාතික ක්‍රීඩකයා ය.

1909 දී ඊසාන දිග චීනයේ ලියෝනිං පළාතේ දාලියැන් නගරයේ දී උපත ලැබූ ලියු චන් චුන් බාල වියේ සිටම ක්‍රීඩාවට උනන්දුවක් දැක්වූ කෙනෙකි. 1932 දී විශ්ව විද්‍යාලයෙන් ක්‍රීඩා විෂය පිළිබඳව උපාධියක් ලබාගත් ඔහු ඒ වන විටත් ඉතා දක්ෂ කෙටි දුර ධාවකයෙක් ලෙසින් ප්‍රසිද්ධ වී සිටියේ ය. එම කාලයේ චීනය පැවතුණේ ඉතා අයහපත් තත්වයක ය. විවිධ අධිරාජ්‍යවාදී රටවල් චීනයේ විවිධ පළාත් අල්ලගෙන සිටියහ. චීන ජනතාව ජීවත් වූයේ ඉතා අසීරුවෙනි. මේ අතර 1932 ඇමෙරිකවේ පැවති 10 වෙනි ඔලිම්පික් උළෙලට ක්‍රීඩකයින් ඉදිරිපත් කිරීමට චීනයට ප්‍රථම වරට අවස්ථාව හිමි විය. චීනය ඒ සඳහා තෝරා ගනු ලැබුවේ එක් ක්‍රීඩකයෙකු පමණි. ඔහු ලියු චන් චුන් නම් ක්‍රීඩකයායි.

හමුදා ජෙනරාල් වරයාගේ ආධාරය ඇතිව චීනයේ ඔලිම්පික් උළෙලක් නියෝජනය කළ ප්‍රථම ක්‍රීඩකයා ලෙසින් ලියු චන් චුන් සිය පුහුණුකරු සමඟ ඇමෙරිකාව බලා නෞකාවකින් ගමන් ඇරඹීය. එය ඉතා දුෂ්කර ගමනකි. දින 21 කට පසු ඔවුහු ලොස් ඇන්ජලීස් නගරයට පැමිණියහ. එහි සිටි චීන ජාතිකයෝ මේ දෙදෙනා ඉතා සාදරයෙන් පිළිගත්හ.




ලියු චන් චුන්

දින 21ක දිගු නැව් ගමන හේතුවෙන් ලියු චන් චුන් ගේ සෞඛ්‍ය තත්වය තරමක් අයහපත් අතට හැරී තිබිණ. ඒ බැවින්, ඔහුට මීටර් 400 තරග ඉසව්වට සහභාගි වීමට අවස්ථාවක් නොලැබිණ. ඔහු මීටර් 100 සහ 200 තරග වලට සහභාගි වුවත් සාර්ථක ප්‍රතිඵලයක් ලබා ගැනීම අසීරු විය. එහෙත් ක්‍රීඩා උළෙල අවසන් වී ඔහු නැවත චීනයට පැමිණි අවස්ථාවේදී චීන ජනතාව ඔහු පිළිගනු ලැබුවේ මහත් හරසරිණි. එම කාලයේ චීන ජනතාවට ඔලිම්පික් ක්‍රීඩා උළෙලට සහභාගි වීමට අවස්ථාවක් ලැබීම පමණක් ම ජයග්‍රහණය තරම්ම වැදගත් කරුණකි.

එයින් වසර 4කට පසුව ලියු චන් චුන් ට ජර්මනියේ පැවති ඔලිම්පික් උළෙලට යළිත් වරක් චීනය නියෝජනය කිරීමේ වරම හිමි විය. දින 20කට වඩා වැඩි නෞකා ගමන නිසා ඇති වූ අයහපත් සෞඛ්‍ය තත්වය එවර ද ඔහුගේ ජයග්‍රහණයට හරස් විය. දෙවරක්ම සිදුවූ ඒ අවාසනාවන්ත අසාර්ථක සිදුවීම ලියු චන් චුන් ගේ ජීවිතයේ සදාකාලික වේදනාවක් බවට පත් වී තිබිණ.

ක්‍රීඩාව පිළිබඳව බොහෝ දැනුම් සම්භාරයක් හිමි කරගත් ඔහු චීනයේ විශ්ව විද්‍යාල කීපයකම ක්‍රීඩා ගුරුවරයෙක් ලෙසින් කටයුතු කළ අතර ඔහු ක්‍රීඩාව පිළිබඳව පොත් කීපයක්ද ලියා පළ කර තිබේ.

ඔලිම්පික් උළෙලක් නියෝජනය කළ ප්‍රථම චීන ජාතික ක්‍රීඩකයා ලෙසින් ඉතිහාසයට එක්වූ ලිය චන් චුන් හැත්තෑ හතර වන වියේදී 1983 දී ජීවිතයෙන් සමුගත්තේ ය.

එදා කෝටි 40ක චීන ජනතාව අතරින් ඔලිම්පික් උළෙලට සහභාගි වූ එකම පුද්ගලයා බවට පත්වූ ඔහු චීන ජාතිකයින්ගේ ආත්ම ගරුත්වයේ බර තම කරට ගනිමින් චීන ඔලිම්පික් චින්තනයේ ප්‍රථමයා බවට පත් විය. චීන ක්‍රීඩකයින් ඔලිම්පික් රන් පදක්කමක් දිනා ගැනීමේ දිනය සහ චීනයේ ඔලිම්පික් උළෙලක් පැවැත්වෙන දිනය ඔහුගේ ජීවිතයේ වැදගත්ම සිහින බවට පත්ව තිබිණ. ඉන් පළමු සිහිනය සැබෑ වූයේ ඔහුගේ මරණයෙන් වසරකට පසුවයි. ඒ 1984 ඇමෙරිකාවේ පැවති ඔලිම්පික් උළෙලේ දී චීනය රන් පදක්කම් රැසක් හිමි කර ගැනීමයි. අනෙක් සිහිනය අති සාර්ථකව සැබෑ වූයේ වසර 2008 බෙයිජිං ඔලිම්පික් ජයග්‍රහණයෙනි. කෙසේ වුව ද ලියු චන් චුන් ප්‍රමුඛ චීන ජාතිකයින් දුටු අසීරු ඔලිම්පික් සිහිනයන් සැබෑ වීම පසුපස ඇත්තේ කැපවීම සහ අප්‍රතිහත ධෛර්යය පිළිබඳ කතාන්දරයකි.

ලියු චන් චුන් මැලේසියානු ක්‍රීඩකයකු සමඟ



# 《每日汉语》 එදිනෙදා චීන බස

# 第一课　打招呼 dǎ zhāo hū

## 1 වැනි පාඩම - ආමන්ත්‍රණය

### 今日关键

**අද පාඩමෙන් අවධානය**

| | |
|---|---|
| 你好。nǐ hǎo | ආයුබෝවන්. |
| 你叫什么名字？nǐ jiào shén me míng zì | ඔයාගේ නම මොකක් ද? |
| 这是我的名片。zhè shì wǒ de míng piàn | මේ මගේ නම් පත. |
| 好久不见。hǎo jiǔ bú jiàn | සෑහෙන කාලෙකින් දැක්කෙ (නෑ). |

### 对话一

**පළමු සංවාදය**

| | |
|---|---|
| A： 你好。nǐ hǎo | ආයුබෝවන්. |
| B： 你好。nǐ hǎo | ආයුබෝවන්. |
| A： 您好。nín hǎo | ආයුබෝවන්. |
| B： 您好。nín hǎo | ආයුබෝවන්. |

### 对话二

**දෙවන සංවාදය**

| | |
|---|---|
| A： 你叫什么名字？nǐ jiào shén me míng zì | ඔයාගේ නම මොකක් ද? |
| B： 我叫王龙。wǒ jiào wáng lóng | මගේ නම වං ලොං. |
| A： 你叫什么名字？nǐ jiào shén me míng zì | ඔයාගේ නම මොකක් ද? |
| B： 刘陆。liú lù | ලියු ලු (නමක්). |

### 对话三

**තෙවන සංවාදය**

| | |
|---|---|
| A： 这是我的名片。zhè shì wǒde míng piàn | මේ මගේ නම් පත. |
| B： 谢谢。xiè xiè | ස්තුතියි. |
| A： 好久不见, 你好吗？hǎo jiǔ bú jiàn, nǐ hǎo ma？ | සෑහෙන කාලෙකින් දැක්කෙ. ඔයාට කොහොම ද? |
| B： 挺好的。tǐng hǎo de 谢谢。xiè xiè | බොහොම හොඳින්. ස්තුතියි. |

### චීන සංස්කෘතියෙන් බිඳක්

你好 nǐ hǎo කියන සුලභ ආමන්ත්‍රණය වෙනුවට සමහර විටෙක 您好 nín hǎo කියන යෙදුම ඔබට අසන්න ලැබෙනවා. 你好 nǐ hǎo කියා අපි සාමාන්‍යයෙන් ආමන්ත්‍රණය කරන්නේ සමාන වයසේ හෝ සමාජයේ සමාන තලයේ හෝ සිටින අය සමගයි. හැබැයි වයසින් වැඩිහිටි හෝ සමාජ මට්ටමින් උසස් අයෙකුට අපි 您好 nín hǎo කියලා ආමන්ත්‍රණය කරන්නේ ඔහුට හෝ ඇයට ගරුත්වය හා විනීත බව පෙන්වීමටයි.

## 《每日汉语》එදිනෙදා චීන බස

## 第二课　感谢 gǎn xiè

## 2වැනි පාඩම - ස්තූතිය පළ කිරීමේ ආකාර

### 今日关键

**අද පාඩමෙන් අවධානය**

| | |
|---|---|
| 谢 xiè 谢 xiè /谢 xiè 谢 xiè 你 nǐ | ස්තූතියි. ඔයාට (ඔබට) ස්තූතියි. |
| 非 fēi 常 cháng 感 gǎn 谢 xiè | ඔයාට (ඔබට) බොහොම ස්තූතියි. |
| 不 bù 用 yòng 谢 xiè | ස්තූති කරන්න එපා. |
| 对 duì 不 bù 起 qǐ | සමාවෙන්න. |
| 没 méi 关 guān 系 xi | ඒක මහ දෙයක් යැ./ ඒක සුළු දෙයක් නෙ. |
| 没 méi 事儿 shìr | ඒකට කමක් නෑ. |

### 对话一

**පළමු සංවාදය**

| | |
|---|---|
| A: 非 fēi 常 cháng 感 gǎn 谢 xiè! | ඔයාට බොහොම ස්තූතියි. |
| B：不 bù 用 yòng 谢 xiè! | ස්තූති කරන්න එපා. |

### 对话二

**දෙවන සංවාදය**

| | |
|---|---|
| A：对不起 duì bù qǐ | සමාවෙන්න. |
| B：没 méi 关系 guān xi | ඒකට කමක් නෑ./ ඒක සුළු දෙයක් නෙ. |
| A：对不起 duì bù qǐ | සමාවෙන්න. |
| B：没 méi 事儿 shìr | ඒකට කමක් නෑ. |

### චීන සංස්කෘතියෙන් බිඳක්

චීන ජනතාව කවදත් ආගන්තුක සත්කාරයට බොහොම ප්‍රසිද්ධයි. අමුත්තන්ට සංග්‍රහ කරන්න තමන්ට හැකි උපරිම අන්දමින්ම කෑම බීම සූදානම් කිරීම සමහර විට පටන් ගන්නේ අමුත්තන් නිවසට එන්නට දින ගණනාවකටම පෙර සිටයි. හැබැයි කොපමණ කෑම බීම වලින් කෑම මේසේ පිරිලා තිබුණත් ඔබට ඒ නිවැසියන්ගෙන් අහන්න ලැබෙන බොහොම සුලභ කථාවක් තමයි "අනේ කෑම බීම නම් අඩු පාඩු ඇති, ඒ ගැන මුකුත් හිතන්න එපා" යන්න. ඒ තමයි චීන මිනිස්සු තමන්ගේ අමුත්තන්ට දක්වන උපරිම ගරුත්වයේ එක ලක්ෂණයක්.





# ටිබෙට් ඉතිහාසය

චීනය එක්සත් බහුජාතික රටකි. එදා මෙදා තුර ටිබෙටය චීනයේ පරිපාලන ඒකකයක් වශයෙන් චීනයෙන් වෙන් කළ නොහැකි කොටසකි. එම ප්‍රදේශය ටිබෙට් ස්වායත්තය වශයෙන් හැඳින්වෙයි. ක්‍රිස්තු පූර්ව කාලයේ ටිබෙට් ජාතිකයන්ගේ මුතුන් මිත්තන් සහ චීනයේ විසූ ප්‍රධාන ජාතිය වන හන් ජාතිකයන් අතර සමීප සබඳතාවක් පැවතුණි.

ක්‍රි.ව. 7වන සියවසේ මුලදී ටාං රාජ පෙළපත ආරම්භ විය. ඒ වන විට චීනයේ පාලන බලය බෙදී වෙන් වී තිබිණ. ඉන් පසු ටාං රාජ පෙළපත ක්‍රමයෙන් බලවත් වී රට එක්සේසත් කර ටාං රාජධානිය පිහිටුවූවේ ය. ඒ සමඟම ටිබෙටයේ සොන්සාන් ගාම්බෝ එහි ගෝත්‍ර කිහිපයක් එක්සත් කර තුබෝ රාජධානිය පිහිටුවූවේ ය.

දෙපාර්ශ්වයේ රාජකීය පවුල් අතර විවාහ සබඳතා ඇති වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ටාං රජ සමයේ ටිබෙට් ජනයා සහ චීනයේ විසූ හන් ජනයා අතර සබඳතා අලුත් වෙන්න පටන් ගත්තේ ය. මේ නිසා ශක්තිමත් ආර්ථික සංස්කෘතික හා දේශපාලන එකඟතා ගොඩ නැඟුණි. ටාං රාජධානියේ වෙන්චෙං කුමාරිය ටිබෙටයේ රජු සොන්සාන් ගාම්බෝ හා විවාහ විය. මේ වන විටත් වෙන්චෙං කුමරියගේ පිළිමය ටිබෙට් ස්වායත්තයේ පොටාලා මාළිගයේ පූජනීයත්වයෙන් ගරු සැළකිලි ලබයි.

එමෙන්ම ටාං සහ තුබෝ සබඳතාව ඔවුන් නියෝජනය කළ භූමි ප්‍රදේශ හා ජනතාව එකට එකතු කිරීමේ ගිවිසුමකට යොමු විය. ඒ අනුව ඉදි කෙරුණු සිහිවටනයක් ටිබෙටයේ ජෝකන් ආරාමයේ අදත් දක්නට ලැබේ.

13වන සියවසේ මැද භාගයේදී ටිබෙටය චීනයේ යුවාන් රාජ වංශය සමඟ නිළ වශයෙන් ඒකාබද්ධ විය. චීනයේ රාජ වංශ ගණනාවක් ඉන් පසු බලයට පත් ව තිබුණත් ටිබෙටය අඛණ්ඩව පැවතුණේ චීන මධ්‍යම රජයේ අණසක යටතේ ය. වසර 1279දී සමස්ත චීනය එක්සත් කොට යුවාන් රාජ වංශය පිහිටුවනු ලැබුවේ මොන්ගෝලියානු හමුදාව විසිනි. ඒ සමඟම ටිබෙටය යුවාන් රාජ වංශය යටතේ සෘජුවම පාලනය වන පරිපාලන ප්‍රදේශයක් බවට පත් විය.

ටිබෙට් ප්‍රදේශයේ වැදගත් යුධමය හා දේශපාලන කටයුතු වෙනුවෙන් යුවාන් අධිරාජයා වෙනම දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට ක්‍රියා කළේ ය. ටිබෙටය තුළ පරිපාලන කටයුතු සඳහා වාන්හූහූ සහ වියැන්හූහූ නමින් කාර්යාල ගණනාවක් ආරම්භ කෙරිණ. එමෙන්ම එහි යුවාන් හමුදා සේනාංක කීපයක් ද ස්ථාපිත කරනු ලැබිණ. එකල ටිබෙටයේ ජන හා දේපළ සංගණන රැසක්ම වරින් වර සිදු කෙරුණේ යුවාන් මධ්‍යම ආණ්ඩුවෙනි.

වසර 1368දී චීනයේ යුවාන් රාජ පෙළපත අවසන් විය. ඒ වෙනුවට මිං රාජ පෙළපත බලයට පත් විය. ටිබෙටයේ පාලනය ද මිං රාජ පෙළපතට උරුම විය. ඒ කාලයේ මිං රාජ වංශයේ අධිරාජයා ටිබෙටයේ විවිධ ප්‍රදේශවල ආගමික නායකයන්ට කුමාර, ධර්ම කුමාර, ජාතික තන්ත්‍ර ගුරු යන ගෞර්ව නාම පිරිනැමුවේ ය.

ටිබෙට් බුදු දහමේ ගේලුග් නිකායේ ප්‍රධාන උරුමක්කාරයන් වශයෙන් පුනරුත්පත්තිය ලද ප්‍රධානියන් දෙදෙනකු ලෙස සැළකෙන්නේ බන්චන් ලාමා සහ දාලයි ලාමා ය. ගේලුග් නිකාය වර්ධනය වූයේ මිං රාජ සමයේ ය. ඒ කාලයේ එක් ආරාමයක නායකයා වූ 3වන දාලයි ලාමාට මිං රාජ්‍ය වංශය විශේෂ සැළකිල්ලක් දැක්විය. වසර 1587දී වජ්‍රාධර දාලයි ලාමා යන ගෞරව නාමය එතුමාට පිරිනමනු ලැබිණ.



ටිබෙටයේ රජු සොන්සාන් ගාම්බෝ සහ ටාං රාජ වංශයේ කුමාරි වෙන්චෙං

මිං රාජ වංශය අවසන් වීමෙන් පසු චිං රාජ වංශය ඇරඹිණ. මෙම රාජ වංශ සමයේදී පස්වන දාලයි ලාමා සහ පස්වන බන්චන් එර්දේනි වෙත ගෞරව නාම පිරිනමමින් ටිබෙටය පාලනය කිරීමේ බලතල පවරා දෙනු ලැබිණ.

වසර 1793දී චිං රාජ වංශය ටිබෙටයේ පාලනය පිළිබඳ වගන්ති 29කින් යුත් නව ව්‍යවස්ථාවක් හඳුන්වා දුන්නේ ය. ලාමාවරුන් පත් කිරීම, හමුදා පරිපාලනය සහ පඩිනඩි ගෙවීම, විදේශ රාජ්‍යයන් සමඟ සබඳතා හා සියලු ගනුදෙනු, චීන මධ්‍යම රජය විසින් සිදු කළ යුතු බව එම ව්‍යවස්ථාවේ වගන්තිවල අන්තර්ගත විය.

භාවිත මුදල් සඳහා කාසියක් සැකසුමටත් එහි දෙපාර්ශ්වයේ සටහන් චීන හා ටිබෙට් භාෂා දෙකෙන්ම තැබීමටත් නියම කිරීම, තවත් වගන්තියකි. එමෙන්ම ලාමාවරුන්ට ලැබෙන පරිත්‍යාග සහ කොමසාරිස්වරුන් විසින් පරික්ෂා කොට ලැයිස්තු ගත කොට මධ්‍යම රජයේ අනුමැතිය වෙත යැවිය යුතුය. මධ්‍යම රජයේ ආධිපත්‍යය ටිබෙටයේ පරිපාලනය මත තහවුරු වන බව වගන්ති විසිනවයෙන් පෙන්නුම් කෙරිණ.

චිං රාජ වංශය පෙරළා දමා වසර 1911දී රට අභ්‍යන්තරයෙන් පැන නැගු විප්ලවය ජයග්‍රහණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් චීන ජන රජය පිහිටුවනු ලැබිණ.

චීන ජන රජයේ ප්‍රථම ජනාධිපති වූ සුන් යත්සෙන් සිය මංගල දේශනය කළේ වසර 1912 ජනවාරි මස පළමුවනදා ය. හන්, මැන්, මොන්ගෝලියානු, හුයි සහ ටිබෙට් යන ජාතීන් සහ ඔවුන් භුක්ති විඳින භූමි ප්‍රදේශ එක්සත් කිරීම, නව ජන රජයේ පදනම වන බව එතුමා කීවේ ය. ඉන් පසු තාවකාලික ජන රජ ව්‍යවස්ථාව සකස් කෙරිණ. ටිබෙටය චීන ජන රජයේ කොටසකැයි එහි පැහැදිලිව සඳහන් විය.

වසර 1940දී චීන ජන රජයේ ස්ථාවර නියෝජිත කාර්යාලයක් ටිබෙටයේ ලාසා නගරයේ ස්ථාපිත කෙරිණ. යුවාන්, මිං සහ චිං රාජ්‍ය පෙළපත්වලදී

මෙන්ම ටිබෙටය කෙරෙහි චීන මධ්‍යම පාලනයේ අණසක චීන ජන රජ සමයේදී ද එක ලෙසම ක්‍රියාත්මක විණ.

වසර 1949දී චීන මහජන සමූහාණ්ඩුව පිහිටුවනු ලැබිණ. ටිබෙට් ඉතිහාසය හා සත්‍ය තත්වයට අනුව චීන මධ්‍යම රජය ටිබෙටය කෙරෙහි සාමකාමී නිදහස් ප්‍රතිපත්තියක් යොදා ගැනීමට තීරණය කළේ ය. වසර 1951 මැයි මස 23වනදා චීන මධ්‍යම රජය සහ ටිබෙට් ප්‍රාදේශීය රජය අතර සාමකාමී නිදහස් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ගිවිසුමකට අත්සන් තැබීය. ජාතිකාරක්ෂාව තහවුරු කිරීම සඳහාත් විදේශ අධිරාජ්‍යවාදී බලවේග විනාශ කිරීම සඳහාත් චීන මහජන විමුක්ති හමුදාව ටිබෙටයට ඇතුළු වීමට සහය දෙන ලෙස චීන මධ්‍යම රජය ටිබෙට් ප්‍රාදේශීය රජයෙන් ඉල්ලීමක් කළ බව මෙම ගිවිසුමේ සඳහන් ය. ටිබෙට් ප්‍රදේශයේ සියලු විදේශීය කටයුතු මධ්‍යම රජයට භාර දිය යුතු වෙයි. මධ්‍යම රජය දාලයි ලාමාවරුන්ගේ ධුරයට ගරු කරන අතර ටිබෙට් ජාතිකයන්ගේ ආගම ඇදහීමේ අයිතියට ගරු කරන බව ද එහි සඳහන් ය. එමෙන්ම ටිබෙටයේ ප්‍රතිසංස්කරණ කළ යුත්තේ ටිබෙට් ප්‍රාදේශීය නායකයන් සමඟ සාකච්ඡා පැවැත්වීමෙනි.



ටිබෙටයේ ලාමාවරුන්

ටිබෙටයට ස්වයංපාලන ක්‍රමයක් හඳුන්වා දිය යුතු බව ද මෙම ගිවිසුමෙහි අවධාරණය කෙරිණ.

වසර 1959 මාර්තු මාසයේදී දැනට චීනයෙන් පළා ගොස් සිටින 14වන දාලයි ලාමාගේ මූලිකත්වයෙන් කැරැල්ලක් සංවිධාන කෙරිණ. ඉන් පසු දාලයි ලාමා රටින් පළා ගියේ ය. දින දෙකක් තුළ කැරැල්ල මර්දනය කිරීමට චීන මධ්‍යම රජය සමත් විය.

අනතුරුව ටිබෙටය පුරා ප්‍රජාතන්ත්‍රික ප්‍රතිසංස්කරණ සිදු විය. ගත වූ වසර 50කට වැඩි කාලය තුළ ටිබෙට් ජාතිකයන්ගේ ප්‍රජාතන්ත්‍රික අයිතීන් ආරක්ෂා කිරීමටත් ජන ජීවිත මට්ටම ඉහළ නැංවීමටත් ආර්ථිකය දියුණු කිරීමටත් චීන මධ්‍යම රජය මහඟු දායකත්වයක් ලබා දී තිබේ.



ටිබෙට් ජාතිකයන්

වසර 1959ට පෙර ටිබෙට් ප්‍රදේශයේ වූයේ වහල්භාවයේ ඉතිහාසයකි. සියයට පහක් තරම් වූ ඉඩම් හිමි රදලයන් හා ලාමාවරුන් සියයට අනූපහක් වූ සාමාන්‍ය ජනතාව මත ආධිපත්‍ය පතුරා තිබිණ. වහලුන් හා ප්‍රවේණි දාසයන් ලෙස සාමාන්‍ය ටිබෙට් ජාතිකයන්ට කිසිදු සමාජ දේශපාලන හෝ ආගමික නිදහසක් නොතිබිණ. වසර 1959 සිට ටිබෙට් ජනතාවගේ පාලකයන් වනුයේ තමන්මය.




# චීන ජනතාවගේ අභ්‍යවකාශ සිහිනය

වසර 2013 චීනයේ විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රයේ දැවැන්ත පියවරක් තැබූ වසරක් ලෙස හැඳින්විය හැකි ය. සෙන්චෝ 10 අභ්‍යාවකාශ යානය සාර්ථක ලෙස ගුවන් ගත කෙරුණේ ඒ වසරෙදී ය. "ශක්තිමත් චීනයක්" සිහිනයේ එක් කොටසක් ලෙස "අභ්‍යාවකාශ සිහිනය" පෙන්වා දිය හැකි ය. චීන ජනතාවට ආඩම්බරයක් වූ මෙම වැඩසටහන තවදුරටත් ශක්තිමත් කිරීමෙන් අභ්‍යවකාශ ගවේෂණයට වැඩි ඉඩකඩක් හිමි වෙයි.

සෙන්චෝ 10 යානය අභ්‍යාවකාශ ගත කළේ වසර 2013 ජුනි මාසයේ 11වනදා පස්වරු 5:38 ට චීනයේ ගන්සු පළාතේ ජියෝ චුවැන් චන්ද්‍රිකා අභ්‍යවකාශ මධ්‍යස්ථානයෙනි.

එම යානය චීනයේ සෙන්චෝ අභ්‍යාවකාශ යාන මාලාවට අයත් එකකි. එය චීනයේ මිනිසුන් සහිත පස්වන අභ්‍යාවකාශ යානය බවට පත් ව ඇත. සෙන්චෝ 10 මෙහෙයුම සාර්ථක කර ගැනීමට එක් වූයේ නියැ හයිෂාං, වාං සියාඕගුවං සහ වාං යාපිං ඇතුළු අභ්‍යාවකාශගාමී කණ්ඩායම වෙති.

සෙන්චෝ 10 අභ්‍යාවකාශ යානයේ ස්වයංක්‍රීය පිරිද්දුම් සාර්ථක වුණේ ජුනි මාසයේ 13වනදා පස්වරුවේ 1:10 ට ය. මේ අනුව ටියැන්ගොං එක අභ්‍යාවකාශ මොඩියුලය සමඟ එය සාර්ථක ව සම්බන්ධ වීය. අභ්‍යාවකාශගාමීන් ටියැංගොං එක අභ්‍යාවකාශ මොඩියුලයේ කුටීර දොරටුව විවර කොට එයට ඇතුළු වූයේ එදින සවස 4:17 ට ය.

චීනයේ ප්‍රථම අභ්‍යාවකාශ දේශනය ජුනි මාසයේ 20වනදා සෙන්චෝ 10 අභ්‍යාවකාශ යානයෙන් විසුරුවා හරින ලදී. එයට සවන් දුන් ශිෂ්‍ය පිරිස මිලියන 60කට අධික ය. මෙම පිරිස රට පුරා විසිරුණු මධ්‍ය පාසැල් 80000කට අයත් වූහ. මෙම දේශනය සිදු කළේ අභ්‍යාවකාශ ගාමිනී වාං යාපිං විසිනි. ඉහළ අභ්‍යාවකාශයේ සිට මෙබඳු දේශනයක් කළ චීන ඉතිහාසයේ ප්‍රථම අවස්ථාව මෙයයි. 33 වියැති ඇය වෘත්තීය ජීවිතය අරඹා ඇත්තේ ප්‍රාථමික





පාසැල් ගුරුවරියක ලෙසයි. ඇය පසුව චීන මහජන විමුක්ති හමුදා ගුවන් නියාමකවරිය ලෙස කටයුතු කළා ය. ඇගේ දේශනය අවස්ථාවේදී සෙන්චෝ 10 යානාව පිහිටා තිබුණේ කිලෝමීටර් 340ක ඉහළ අභ්‍යාවකාශයේය. රූප මාධ්‍ය තක්ෂණය ඔස්සේ සජීවිව ඇය සිසුන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දුන්නා ය. අයිසෙක් නිව්ටන් විසින් සොයා ගන්නා ලද ගුරුත්වාකර්ෂන න්‍යාය අභ්‍යාවකාශ තුළ ක්‍රියාත්මක නොවන ආකාරය ඇය නිදර්ශන සහිතව පැහැදිලි කළා ය. පෘථිවිය වටා කැරකැවෙන බැවින් සෑම විනාඩි අනූවකටම වරක්ම ඇය හිරු උදාව දුටු බවත් මේ අනුව දිනකට 16 වතාවක් හිරු උදාවනු දුටු බවත් ඇය පැවසුවා ය. පොළව සහ තරු දර්ශනය වුවත් පියාඹන පීරිසි වැනි කිසිවක් තමන් නොදුටු බව ඇය සිසුවන්ට පැහැදිලි කළා ය.

නියමු පාලනය යුක්තව ටියැන්ගොං එක අභ්‍යාවකාශ මොඩියුලය සමඟ සම්බන්ධ කෙරුණේ ජුනි මාසයේ 23වනදා උදෑසන 10:07 ට ය. සෙන්චෝ 10 යානයේ නියමු නියැ හයිෂාං එය නිවැරදිව පාලනය කළ අතර චාං සියාඕගුවං සහ වාං යාපිං එයට සමීපව සහයක් ලබා දුන්නෝ ය.

සෙන්චෝ 10 සාර්ථකව යළිත් පෘථිවියට පැමිණියේ ජුනි මාසයේ 26වනදා උදෑසන 8:07 ට ය. එය චීනයේ ඇතුළු මොංගෝලියානු භූමියට පතිත වීය. දින 15ක සාර්ථක අභ්‍යාවකාශ චාරිකාව අවසන් වීය. එදින උදෑසන 9:41 ට නියැ හයිෂාං, චාං සියාඕගුවං සහ වාං යාපිං යන අභ්‍යාවකාශගාමීන් පිළිවෙළින් යානාවෙන් පිටතට පැමිණියහ.

සෙන්චෝ 10 අභ්‍යාවකාශ චාරිකාව සාර්ථක වීම චීන ජනතාවගේ ආඩම්බරයට හේතුවකි. එය විද්‍යා හා තාක්ෂණය දියුණු කිරීමට දරණ සක්‍රීය උත්සාහයෙන් ජීවගුණය රැඳී අවස්ථාවකි. එය චීන ජාතියේ තවත් අභිමානයකි.



# චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය



ශ්‍රී ලංකා ජන ජීවිතය මැනවින් හඳුනාගත් සුහද මිතුරෙකු ලෙස චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ඉදිරි ගමනක් ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාව පුරා විසුරුවා හැරෙන කෙටි තරංග සහ බස්නාහිර පළාත ආවරණය කරන FM තරංග විකාශනයක් සිංහල සේවය සතුවෙයි. සියළු වැඩසටහන්වලට පොඩ්කාස්ටින් සේවාව ඔස්සේද සවන් දිය හැකිය.

සිංහල සේවය ආරම්භ වූයේ වසර 1975 ජනවාරි පළමු දාය. එවක පැවැතියේ කෙටි තරංග විකාශනයක් පමණි. වසර 2010 අප්‍රේල් 23 වනදා එහි FM තරංග විකාශනය ආරම්භ කෙරිණ.

මේ වන විට චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය හා පුවත්පත් සමඟ මනා සහයෝගික සම්බන්ධතාවකින් යුක්තව ඉදිරියට ගමන් කරමින් සිටී.







① 盛　莉　　僧伽罗语部主任

ෂෙං ලී　　සිංහල සේවා අධ්‍යක්ෂිකා

② 王晓东　　国际台学术首席，斯里兰卡调频台总监

වං සියඕ තුං　　විද්වත් පර්ෂද නිලධාරී , CRI ශ්‍රී ලංකා සේවා ප්‍රධානියා

③ 卜　云　　国际台斯里兰卡广播孔子课堂中方负责人

බූ යුන්　　කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ

④ 邵季洋 ෂාඕ ජී යං　⑤ 刘　晖 ලියු හුයි　⑥ 郝丽芳 හාඕ ලී ෆාං　⑦ 张优优 චාං යෝ යෝ　⑧ 石　乐 ශී යුයැ

⑨ 韩　健 හැන් ජියැන්　⑩ 王　莹 වං යිං　⑪ 黄海东 හුවාං හැයි තුං　⑫ 孙佳佳 සුන් ජියා ජියා　⑬ 孙涧超 සුන් ජියැන් චාඕ

⑭ 昌德纳　　僧伽罗语专家

චන්දන තිලකරත්න　　සිංහල සේවා උපදේශක

⑮ 迪尔尚　　僧伽罗语专家

දිල්ෂාන් කීර්තිසර　　සිංහල සේවා උපදේශක

⑯ 阿诺佳　　僧伽罗语专家

අනෝජා දිසානායක　　සිංහල සේවා උපදේශිකා

# සිංහල සේවයේ වැඩසටහන්

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ  සමස්ත පවුල් ඒකකය ඉලක්ක කොට විසුරුවා හරිනු ලැබේ. වැඩසටහන් අන්තර්ගතය චීනය සහ ශ්‍රී ලංකාව අතර ඇති සාම්ප්‍රදායික මිත්‍රත්වය සහ රාජ්‍යතාන්ත්‍රික බැඳීම පදනම් කොට සකස් කර තිබේ. සතියේ දින පහ තුළ, ආර්ථිකය, සංස්කෘතිය, ජන ජීවිතය සහ මිත්‍රත්වය, සංචාරය,  සූප කලාව, චීනයේ භාෂා අධ්‍යයනය වැනි විෂය ක්ෂේත්‍ර ඔස්සේ වැඩසටහන් විකාශනය කෙරේ. විචිත්‍රාංග සමාජ හා කාලීන තොරතුරු සඳහා ද විශේෂත්වයක් හිමිව තිබේ. චීනයේ ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ නැවුම් තොරතුරු රැගත් ප්‍රවෘත්ති විකාශනයක්ද දිනපතා සිදු කෙරේ.

| | Frequency | Time (Sri Lanka) | |
|---|---|---|---|
| FM | CRI - Sri Lanka FM97.9 | 11:30-13:30 | 17:30-19:30 |
| Short wave | 49.8/31.6/30.61/25.21 | 19:30-20:30 | 05:00-06:00 |
| Online | http://sinhalese.cri.cn/ | | |



# කොන්ෆියුසියස් මධ්‍යස්ථානය



කොළඹ ලුම්බිණි විද්‍යාලයේ ස්ථාපනය කරන ලද CRI කොන්ෆියුසියස් මධ්‍යස්ථානය 2009 වර්ෂයේ දී එවකට ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යවරයාව සිටි සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් නිල වශයෙන් විවෘත කරනු ලැබීය.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය චීනයේ හන්බන් හෙවත් කොන්ෆියුසියස් ආයතන මූලස්ථානයේ උපදේශකත්වයෙන් ශ්‍රී ලංකාවේ කොන්ෆියුසියස් මධ්‍යස්ථානයක් පිහිටුවා තිබේ. කොළඹ ලුම්බිණි විද්‍යාල පරිශ්‍රයේ පිහිටුවා ඇති මෙම ලුම්බිණි කොන්ෆියුසියස් මධ්‍යස්ථානය ශ්‍රී ලංකාව හා චීනය යා කරන අධ්‍යාපන හා සංස්කෘතික පාලමක් ලෙස ක්‍රියා කරයි.

ලුම්බිණි විද්‍යාලයේ B සංකීර්ණයේ ස්ථාපිත කොන්ෆියුසියස් මධ්‍යස්ථානය නවීන පහසුකම් වලින් සමන්විත පංති කාමරයක් නිර්මාණය කර ඇත. විසිඅට දෙනෙකුට එකවර අධ්‍යාපනය ලැබිය හැකි සේ සකසා ඇති මෙම පංති කාමරය වායු සමීකරණය කර ඇති අතර සෑම සිසුවකුටම පෞද්ගලිකව භාවිතා කළ හැකි පරිගණක පහසුකම් වලින් සමන්විතය. ඉගැන්වීමේ දී මෘදුකාංග හා මල්ටි මීඩියා පරිහරණය කෙරේ. චීන ජාතික ගුරුභවතුන් ගේ සේවය ලැබෙන අතර තමා කැමති භාෂා මාධ්‍යයකින් ඉගෙනීම කළ හැකිය.

චීන භාෂාව හා සංස්කෘතිය ඉගෙනීමේ අවස්ථාව මෙරට ජනතාවට ලබාදීමට අමතරව දෙරට අතර සංස්කෘතික හුවමාරු කිරීම මෙන්ම ජාත්‍යන්තර තරග වලට සහභාගි වීමේ ඉඩප්‍රස්ථා ද ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ලබා දී ඇත. ශිෂ්‍ය කණ්ඩායම් 51 ක් මේ වන විට චීන භාෂාව පිළිබඳ පදනම් පාඨමාලාව සම්පූර්ණ කොට අවසානය. දක්ෂ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වැඩිදුර අධ්‍යාපනය ලැබීම සඳහා චීනයේ විශ්ව විද්‍යාල වල ඉගෙනීම සඳහා පූර්ණ ශිෂ්‍යත්ව ලබාදී ඇත. ගතවූ කාලය තුළ උපාධි පාඨමාලා හා පශ්චාත් උපාධි අධ්‍යාපනය ද ඇතුළුව චීන විශ්ව විද්‍යාල වලට ශිෂ්‍යත්ව මත යොමු කළ සංඛ්‍යාව 25 දෙනකු පමණ වේ.

හන්බන් ආයතනය විසින් වාර්ෂිකව සංවිධානය කරන චීන පාලම (Chinese Bridge) ජාත්‍යන්තර තරගය සඳහා මධ්‍යස්ථානයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අඛණ්ඩව සහභාගි වී තිබේ. මේ හැර චීනයේ පැවැත්වූ සමර් කෑම්ප් (Summer Camp) හා වින්ටර් කෑම්ප් (Winter Camp) වැනි විවිධ සංස්කෘතික වැඩසටහන් සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහභාගි වී ඇත.








**අවශ්‍ය ද්‍රව්‍ය :**

- බර කිලෝග්‍රෑම් එකක් පමණැති කුකුළෙක්,
- අලුත් නෙළුම් කොළයක්,
- උයන වයින් ග්‍රෑම් 15ක්,
- ලුණු ග්‍රෑම් 2ක්,
- සෝයා සොස් ග්‍රෑම් 10ක්,
- සුදු සීනි ග්‍රෑම් 5ක්.

# නෙළුම් කොළයේ කුකුල් මස්

චීන කෑම ලෝකයේම සුප්‍රසිද්ධයි. ලෝක ජනතාවගෙන් තුනෙන් එකක් දිනපතාම චීන කෑම අනුභව කරනවා. වර්ණය, සුවඳ සහ රසයට පමණක් නොව පෝෂණයට ද චීන සූපවේදයේ හිමි වෙන්නේ සුවිශේෂ ස්ථානයක්. චීනය විශාල දේශභූමිය සහිත රටක්. එබැවින්, කාලගුණය, භූගෝලය, ඉතිහාසය සහ ආහාර සිරිත් වෙනස් වන නිසා, චීන සූපවේදය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස්.

ප්‍රදේශවලට අනුව, චීන සූපවේදය ප්‍රධාන ශාඛා හතරක් තිබෙනවා. ඒ අතරින්, හුවයියාං ශාඛාව ඒ ඒ ඍතුවලට අනුව ආහාර තෝරා ගන්නා අතර ස්වාභාවික රසයට හානි නොකිරීම හේතුවෙන් ප්‍රසිද්ධයි. හුවයියාං ශාඛාවට අයත් කුකුල් මස් ව්‍යාංජනයක් පිළියෙළ කරන ආකාරය ඔබට හඳුන්වා දෙන්නම්. මේ ව්‍යාංජනයට නෙළුම් කොළ භාවිත කෙරෙනවා. එය භාවිත කෙරෙන්නේ මෘදු කුකුල් මස්වලට සුවඳ නෙළුම් කොළ රසය මිශ්‍ර වීම සඳහායි.

**සාදන ක්‍රමය:**

මුලින්ම සම්පූර්ණ කුකුළකුගේ ඇතුළත ඇති අපද්‍රව්‍ය ඉවත් කර හොඳින් සෝදන්න. ඉන් පසු වතුර හොඳින් ඉවත් වන තුරු තබන්න. ඊට පස්සේ උයන වයින්, ලුණු, සුදු සීනි හා සෝයා සොස් මිශ්‍ර කරන්න. අනතුරුව ඒ මිශ්‍රණය කුකුළාගේ පිටත හා ඇතුළත හොඳින් තවරන්න. දැන් අලුත් නෙළුම් කොළයක් ගෙන හෝදන්න. ඊට පස්සේ ඒ කොළය හකුලා කුකුළාගේ උදරය ඇතුල් කරන්න. ඊට පස්සේ ඒ කුකුළා ලොකු බඳුනකට දාන්න. දැන් ඒ ලොකු බඳුන ලිපේ තබා වැඩි ගින්දරෙන් පිසෙන තුරු වාෂ්පෙන් තම්බන්න. ඊට පස්සේ පිසූ කුකුළා එළියට ගෙන සුළං වැදෙන තැනක පැය 4ක් පමණ එල්ලා තබන්න. ඉන් පසු කෑමට ගන්නා විට කුකුල් මස් අතින් කෑලිවලට කඩලා දීසියක තබන්න.



සැබෑ චීන කෑම වේලක රසය විඳගන්න
Moon River
Chinese Sea Food Restaurant
වසර දහයක් පැරණි ඉහළ පෙළේ අවන්හලකි
චීන අරක්කැමියන් විසින් පිසිනු ලබන රසවත් චීන ආහාර
පවුලේ සැමට එකට ආහාර ගත හැකි ඉඩ පහසුකම්
නෑදෑ මිතුරන් සමගින් ඔබේ ප්‍රිය සාදයට කදිම තැනකි
Moon River
Chinese Sea Food Restaurant
No 140, Thimbirigasyaya Road, Colombo 05.
Tele: 0112 596 885

# THE JEWELINK

## *Jewellers & Gem Merchants*

Specialist in Sri Lankan Natural Gems and Gem Studded Jewellery in 22KT, 18KT, 14KT Gold, White Gold and Silver








Ruby
Diamond
Blue Sapphire
Opal
Cat's Eye
Zircon
Emerald
Star Sapphire
Garnet
Amethyst

**3/60, 3rd Floor, Majestic City, Colombo 04. Tel: 0112 585 399**
**GU-03, Ground Floor, Liberty Plaza, Colombo 03. Tel: 0112 574 599**
**Email: samangemparadise@gmail.com**


---

## සුභාසර පාඨක සාමාජිකත්වය

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ඒකාබද්ධව ත්‍රෛයි මාසිකව නිකුත් කරනු ලබන සුභාසර සඟරාවේ පාඨක සාමාජිකත්වය ලබා ගැනීම සඳහා පහත විස්තර පුරවා, 2.5 x 3.5 cm ප්‍රමාණයේ ඡායාරූපයක් සමග අපගේ ලිපිනය වෙත යොමු කරන්න.

නම : ..................................................

ලිපිනය : ..................................................

වයස : .............................. පාසල : ..............................

දුරකථන : .............................. විද්‍යුත් ලිපිනය : ..............................

ප්‍රශ්නය : මෙවර සුභාසර කලාපයේ ඔබ වඩාත් කැමති ලිපිය කුමක්ද?

පිළිතුර : ..................................................

අපගේ ලිපිනය : **CRI Confucius Classroom at Lumbini College,**
Lumbini College, P. O. Box: 1774, Havelock Town Colombo 05, Sri Lanka




# චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

චීනය සහ ජාත්‍යන්තර ප්‍රජාව එකට එක් කරමින් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ආරම්භ කෙරුණේ 1941 දෙසැම්බර් මස 3 වැනි දාය. අද වන විට එය ලොව පුරා වැඩිම භාෂා ගණනාවක් විකාශනය කරන විශාලතම ගුවන් විදුලි ජාලයක් බවට එය පත්ව තිබේ. එයින් ලොව පුරා විකාශනය කෙරෙන භාෂා ගණන මේ වන විට 65කි. ලෝකයේ සංනිවේදන විධික්‍රම වඩාත් පුළුල් වීමත් සමඟ අන්තර්ජාල රූප මාධ්‍ය හා ජංගම දුරකථන සහ පොඩ්කාස්ටින් වැනි නූතන බහුවිධ මාධ්‍ය ඔස්සේ සිය විකාශන ජාලය ශක්තිමත් කිරීමට චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය පියවර ගත්තේය. ඒ අනුව වසර 2011 ජනවාරි 18 වනදා CIBN චීන අන්තර්ජාතික ගුවන්විදුලි විකාශන ජාලය ආරම්භ කෙරිණ. වසර 2013 වන විට විදේශ නාගරික ගුවන් විදුලි සේවා 91ක් සහ FM හා අන්තර්ජාල ගුවන් විදුලි සේවා 22ක් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සතු වෙයි. රටවල් 32ක ප්‍රවෘත්ති වාර්තාකරණ ඒජන්සි ආයතන පිහිටුවා තිබේ. ලොව පුරා විසිරුණු කොන්ෆියුසියස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 13කි. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අසන්නන්ගේ සමාජ 4114ක් ලොව පුරා ක්‍රියාත්මකය.

中 国 国 际 广 播 电 台
CHINA RADIO INTERNATIONAL

**SINHALA SERVICE**
**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040
Tel: 00 86 10 6889 2330/2374
Fax: 00 86 10 68892361
Email: sinhalaservice@gmail.com
Web: http://sinhalese.cri.cn/
Facebook: Cheena Sinhala handa
Twitter: Voice of China-Lanka